# සටහන

2014 සැප්තැම්බර් - ඔක්තෝබර්


රුසියාවේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක් 2

ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව නව කියවීමකට ලක් වූ ආයතනික යහපාලන සංකල්පය සහ එහි නූතන දිශානතිය 3

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ජාතික ප්‍රතිරූපය ඉහළ නැංවීම 11

සංවර්ධනය විෂයෙහි ලා මූල්‍ය සාක්ෂරතාවේ වැදගත්කම 19



රු. 20/-


සටහන සැප්./ඔක්. 2014 රු. 20/-

041000781

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# රුසියාවේ


## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



භූමි ප්‍රමාණය අතින් ලෝකයේ විශාලතම රට රුසියාවයි. එය උතුරු යුරෝ ආසියාවෙහි පිහිටියේය. රුසියාව අසර්බයිජානය, බෙලාරුසය, චීනය, එස්තෝනියාව, ෆින්ලන්තය, ජෝර්ජියාව, කසකස්තානය, උතුරු කොරියාව, ලැට්වියාව, ලිතුවේනියාව, මොන්ගෝලියාව, නෝර්වේ, පෝලන්තය සහ යුක්රේනය යන රටවලට මායිම් වේ. නිල වශයෙන් හැඳින්වෙන්නේ රුසියානු සමූහාණ්ඩුව ලෙස යි. රුසියාවේ අගනගරය මොස්කව් ය. විශාලතම ඛනිජ සහ බලශක්ති සංචිතයක් රුසියාවට හිමිය. එමෙන්ම එය ලොව විශාල වශයෙන් ඛනිජ තෙල් සහ ස්වභාවික වායු නිපදවන රටවලින් එකකි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිෂේධ බලය හිමි රටක් වන රුසියාව ජී 20, යුරෝපා හවුල, ආසියා පැසිපික් ආර්ථික සහයෝගීතාව, ෂැංහයි සහයෝගීතා සංවිධානය, ලෝක වෙළෙඳ සංවිධානය යනාදී සංවිධාන රැසක සාමාජිකයෙකු වේ.

රුසියානු ජනාධිපතිවරයා ව්ලැඩිමීර් පුටින්ය.■

| | |
|---|---|
| භූමි ප්‍රමාණය | වර්ග කි.මී. 17,098,242 |
| ජනගහනය (2014 ජූලි ඇස්තමේන්තු) | 142,470,272 |
| ජනගහන වර්ධන වේගය (2014 ඇස්තමේන්තු) | -0.03% |
| ජන ඝනත්වය (වර්ග කිලෝ මීටරයට පුද්ගලයින්) | 8.3 |
| උපත් අනුපාතය (2014 ඇස්තමේන්තු)(ජනගහනය දහසකට) | 11.87 |
| මරණ අනුපාතය (2014 ඇස්තමේන්තු)(ජනගහනය දහසකට) | 13.83 |
| උපතේදී ආයු අපේක්ෂාව (අවුරුදු) | 70.16 |
| දළ දේශීය නිෂ්පාදිතය (2013) | එ.ජ. ඩොලර් ට්‍රිලියන 2.553 |
| ඒක පුද්ගල ද.දේ.නි. (2013) | එ.ජ. ඩොලර් 18,100 |
| මූර්ත ද.දේ.නි. යේ වර්ධන අනුපාතය (2013) | 1.3% |
| ද.දේ.නි. යේ ආංශික සංයුතිය(2013) | කෘෂිකර්මය 4.2% කර්මාන්ත 37.5% සේවා 58.3% |
| රාජ්‍ය ණය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (2013) | 7.9 % |
| අයවැය අතිරික්තය (+) හිඟය (-) ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (2013) | -0.5 % |
| උද්ධමනය (CPI) | 6.8% |
| විදේශ සංචිත (2013 දෙසැම්බර් ඇස්තමේන්තු) | ඩොලර් බිලියන 515.6 |
| ශ්‍රමබලකාය (2013) | මිලියන 75.29 |
| සේවා වියුක්ති අනුපාතය (2013) | 5.8% |
| සාක්ෂරතාව | 99.7% |
| ප්‍රධාන අපනයන | පෙට්‍රෝලියම් සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන, ස්වභාවික වායු, ලෝහ, දැව සහ දැව නිෂ්පාදන, රසායන ද්‍රව්‍ය, යුධ උපකරණ |
| ප්‍රධාන අපනයන රටවල් | නෙදර්ලන්තය, චීනය, ජර්මනිය, ඉතාලිය, තුර්කිය, යුක්රේනය, මැලේසියාව, බෙලාරුසය |
| ප්‍රධාන ආනයන | යන්ත්‍රෝපකරණ, වාහන, ඖෂධ නිෂපාදන, අර්ධ නිමි ලෝහ නිෂ්පාදන, ප්ලාස්ටික්, මස්, පළතුරු සහ ඇට, දෘෂ්‍ය සහ වෛද්‍ය උපකරණ, යකඩ, වානේ |
| ප්‍රධාන ආනයන රටවල් | චීනය, ජර්මනිය, යුක්රේනය, ජපානය, එක්සත් ජනපදය, ප්‍රංශය, ඉතාලිය |
| රුසියානු රූබල් / ශ්‍රී ලංකා රුපියල් අනුපාතය | 2.149 (2015.02.19) |



"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

33 වෙළුම 9-10 කලාපය 2014 සැප්තැම්බර්/ඔක්තෝබර්

ISSN 1391-3697

වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව නව කියවීමකට ලක් වූ ආයතනික යහපාලන සංකල්පය සහ එහි නූතන දිශානතිය

**නිෂාදි තෙන්නකෝන්**
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂිකා
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පසුගිය ලෝක මූල්‍ය අර්බුද සමයේ දී ලොව පුරා මූල්‍ය ආයතනවල සහ අධිකාරි - නියාමන ආයතනවල අවධානයට ලක් වූ සුවිශේෂ කරුණක් නම් අස්ථාවර තත්ත්වයන්ට මුහුණ පෑ බොහොමයක් මූල්‍ය ආයතන දුර්වල යහපාලනයකින් (Corporate Governance) යුක්ත වූ බව සොයා ගැනීමයි. ශ්‍රී ලංකාවේ ''ප්‍රමුඛ බැංකුව'' බිඳවැටීමේ සිදුවීම හා මෑතකාලීනව පැන නැගුන බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි අර්බුදකාරි තත්ත්වයන් පිරික්සන විට ද අදාළ ආයතනවල පැවති අසංවිධිත හා අකාර්යක්ෂම යහපාලන ක්‍රමවේදයන් එම අර්බුද සඳහා ප්‍රධාන කොටම හේතු වී ඇති බව විද්‍යමාන වෙයි.

ඒ අනුව ''සාංගමික යහපාලනය මූල්‍ය ආයතනයක ස්ථාවරත්වයට පමණක් නොව ඉන් ඔබ්බෙහි සමස්ත මූල්‍ය පද්ධතියේ ම සංහිඳියාවටත් බලපෑමක් ඇති කරන්නේය'' යන කරුණ වර්තමාන මූල්‍ය ආයතන පද්ධතිය සළකන කල අන් කවරදාටත් වඩා අවධානය යොමු කළ යුතු සත්‍යයකි. ආයතනික යහපාලන සංකල්පයේ වැදගත්කම මූල්‍ය පද්ධති ස්ථාවරත්ව කෝණයෙන් විමසා බැලීම, මූලික වශයෙන් පසුගිය මූල්‍ය අර්බුදයෙන් ඉක්බිතිව එම සංකල්පයට හිමි වූ වැදගත්කම සහ ඒ ආශ්‍රිත ප්‍රායෝගික නව නැඹුරුතා පිරික්සීම මෙම ලිපියේ අරමුණයි.

## ආයතනික යහපාලනයේ සැබෑ අරුත

විවිධ නිර්වචන හා නිර්ණායක ඔස්සේ හඳුන්වා දිය හැකි යහ පාලන සංකල්පය ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානය (Organisation for Economic Co-operation and Development-OECD) මගින් නිර්වචනය කර ඇත්තේ 'සමාගමක කළමනාකාරිත්වයත් එහි අධ්‍යක්ෂ මණ්ඩලයත්, කොටස් හිමියන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයනුත් අතර පවත්නා මනා සම්බන්ධතාව' වශයෙනි[1]. එමගින් සමාගමක අරමුණු සකස් කිරීම සඳහා ව්‍යූහයක් සපයන අතර එම අරමුණු ඉටු කර ගන්නා ආකාරය හා අදාළ ක්‍රියාකාරිත්වයන් අධීක්ෂණය කරන ආකාරය තීරණය කරනු ලබන බව ද එහි ලා සඳහන් වේ.

මේ අනුව විධිමත් යහපාලන රාමුවක් මගින් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයටත්, කළමනාකාරීත්වයටත් සමාගමෙහි සහ කොටස් හිමියන්ගේ යහපත වෙනුවෙන් සමාගමෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරන පසුබිමක් සැකසිය යුතු අතර, කාර්යක්ෂම අධීක්ෂණයකට හා සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමකට ද මග පාදයි. සැබවින්ම ආයතනික යහපාලනය යනු කොටස් හිමියන්, සේවකයන්, ආයෝජකයන්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන් හා මහජන ප්‍රජාව යන සියලු පාර්ශ්වයන්ගේ යහපත වෙනුවෙන් සමාගමක් මෙහෙයවනු ලබන හා පාලනය කරනු ලබන ක්‍රමවේදය ලෙස පුළුල්ව හඳුනා ගත හැකිය.

යම් ආයතනයක ක්‍රියාකාරීත්වය ගමන් කරන දිශාව පිළිබඳවත්, එහි කාර්ය භාරය හා වගකීම් පිළිබඳවත්

1 http://stats.oecd.org/glossary/detail.asp?ID=6778accessed 12 OCT 2014

එම ආයතනයේ කළමනාකාරිත්වය විසින් පිළිපදිනු ලබන ප්‍රතිපත්තීන් මෙකී ක්‍රමවේදයට ඇතුළත් වේ. හුදෙක් සමාගමේ යහපත් පැවැත්ම පමණක් ම සාංගමික යහපාලනය යන්නෙන් අර්ථ නොගැන්වෙන අතර එය ආර්ථික හා සමාජ ප්‍රගමනයකට ද පෙරටුගාමී මෙහෙවරක් ඉටු කළ යුතුය. වර්තමාන ලෝකය තුළ සමාගම් යනු ආර්ථික හෝ මූල්‍ය ආයතන පමණක් ම නොවන අතර ඒවා සමාජ ආර්ථික ප්‍රගතියේ නියමුවන් ලෙසට සුවිශේෂ මෙහෙවරක් ඉටු කරනු ලබන බැවින් එබඳු ආයතනයන්හි යහපාලනය යථෝක්ත අයුරින් සමාජ ආර්ථික පසුබිමෙහි උන්නතිය හා සමගාමීව සළකා බැලිය යුතුය.

කෙසේ වෙතත් ආයතනික යහපාලන ප්‍රතිපත්තිය තුළ සියලුම පාර්ශ්වයන්ගේ අයිතීන් ආරක්ෂා කරමින් සමාගමක කටයුතු සාර්ථකව මෙහෙයවීමට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාපටිපාටිය ද අන්තර්ගත විය යුතුය යන්න ද විතර්කයෙන් තොර කරුණකි.

**එන්රොන් සමාගම බිඳ වැටීමෙන් පසු හෙළි වූ කළමනාකරණ-විගණන අක්‍රමිකතා**

ආයතනික යහපාලනයෙහි වැදගත්කම විවිධ ආයතන බිඳවැටීම්වලදී සාකච්ඡාවට ලක් වී ඇත. ඇමරිකා එක්සත් ජනපදයෙහි හත් වෙනි විශාලතම පොදු සමාගම වූ එන්රොන් (Enron)[2] සමාගම බිඳ වැටීමට අවදානම් සහගත ගිණුම් කටයුතු, සම්බන්ධිත පාර්ශ්වයන් සමග කෙරෙන ගනුදෙනු (Related Party Transactions), ඇතැම් අයිතීන් අතර ගැටීම් ඇති කරන ආකාරයේ කටයුතු සහ ගිණුම්ගත නොකළ ගනුදෙනු පවත්වාගෙන යෑම තුළින් කළමනාකාරිත්වය අයුතු ඉහළ දීමනා ලබා ගැනීම සහ අයුතු ලෙස මුදල් අයකර ගැනීම ප්‍රධාන ලෙසම බලපෑ බව වාර්තා විය. ඉහත කී කළමනාකාරිත්ව අක්‍රමිකතා දිගු කලක සිට නිරීක්ෂණය කරන ලද නමුත් Enron සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස් හිමියන් හා අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ අයිතීන් සුරැකීමට පියවර නොගෙන එම අකටයුතු නොතකා හරින ලදී. Enron සමාගමෙහි බිඳ වැටීම හේතුවෙන් එහි කොටසක අගය ඇමෙරිකානු ඩොලර් 90 සිට ඩොලරය දක්වා පහත වැටුණු අතර දහස් ගණනක් සේවකයන්ට රැකියා අහිමි විය.

Enron සමාගමට අදාළව වාර්තා වූ කැළඹිලි සහගත නිරීක්ෂණ අතර එකක් ලෙස එම සමාගමෙහි විගණකවරුන් ලෙසට කටයුතු කළ Arthor Anderson විගණක සමාගම ද ඉහළ ගාස්තු ලබමින්, විගණක වෘත්තියට අදාළ වෘත්තීමය ආචාරධර්ම කඩ කරමින් Enron හි වංචනික ක්‍රියාවන්ට හවුල් වී තිබීම දැක්විය හැකිය.

මේ හා සමාන ම කරුණක් ශ්‍රී ලංකාවේ එක්තරා මුදල් සමාගමක් සම්බන්ධව ද මෑතකදී වාර්තා විය. එම මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහජන මුදල් අයථා ලෙසට පරිහරණය කරමින්, සාවද්‍ය මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කරමින් වංචනික හා අක්‍රමිකතා ගණනාවක් සිදු කර තිබිණි. මේ සම්බන්ධව අපක්ෂපාතී ස්වාධීන නිරීක්ෂණයන් සිය වාර්තාවන්හි පළ කිරීමට එම සමාගමෙහි විගණකවරුන් ද අසමත් වී තිබූ බව පසුව කරන ලද චෝහාරාත්මක විගණනයන්හිදී අනාවරණය වූ අතර එයට අදාළ පරීක්ෂණ මේ වනවිට නීතිය ක්‍රියාත්මක කරන ආයතන මගින් සිදු කරනු ලබයි.

**ගෝලීය අර්බුදයේ න්‍යෂ්ටිය හෙවත් ලේමන් බ්‍රදර්ස් හි දුර්වල පාලන ව්‍යුහය**

මෙම සංකල්පය විවිධ ආයතනයන්හි වංචා හා දූෂණ ක්‍රියාමාර්ගයන්ට විසඳුම් සෙවීමේදී වරින් වර සාකච්ඡාවට බඳුන්ව තිබෙන නමුත් එය වැඩි අවධානයක් දිනා ගනුයේ 2008-2009 මූල්‍ය අර්බුදයට සමගාමීවය. එම ආර්ථික අවපාත සමයේදී කරන ලද නිරීක්ෂණයන් තුළින් යහපත් පාලන ක්‍රමවේදයන් හා මනා පරිචයන් අනුගමනය කිරීම සඳහා ලොව පුරා මූල්‍ය ආයතනයන්ට දැඩි පෙළඹවීම් ඇති කරන ලදී.

සාංගමික යහපාලනයෙහි වැදගත්කම පිළිබඳව අන්තර් ජාතික වශයෙන් අවධාරණය කරන ලද තවත් සිදු වීමක් ලෙසට ලේමන් බ්‍රදර්ස් (Lehman Brothers)[3] සමාගම බුන්වත් බවට පත් වීම සැළකිය හැකිය. එම සමාගමෙහි පැවති අධික අවදානම් සහගත කටයුතු සම්බන්ධව නිසි පියවර ගැනීමට අසමත් වූ දුර්වල ආයතනික යහපාලන රාමුව අවසානයේ ගෝලීය ආර්ථික අර්බුදයක් නිර්මාණය කිරීමට දායක විය. දුර්වල අවදානම් කළමනාකරණය, අධ්‍යක්ෂ මණ්ඩලයට හා අනෙකුත් පුද්ගලයන්ට අධික ගෙවීම් සිදු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ දුර්වල තීරණ ගැනීම යනාදිය මගින් ඉහත කී දුබල නීති රාමුව පැහැදිලි වේ. එහි දුර්වල කළමනාකරණය සනාථ කරමින් ඇමරිකානු අධිකරණයක් මගින් පත් කරන ලද විමර්ශකයෙකුගේ වාර්තාවක ලේමන් සමාගම දිගින් දිගට ම එහි අභ්‍යන්තර අවදානම් සීමාවන් සහ පාලනයන් උල්ලංඝනය කළ බව (Lehman repeatedly exceeded its own internal risk limits and controls) සඳහන් වේ. එම වාර්තාව මගින් ලේමන් බ්‍රදර්ස් සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු විධායක නිලධාරීන් විසින් මූල්‍ය වංචාවක් සිදු කර අධීක්ෂණ අධිකාරීන්ට සාවද්‍ය තොරතුරු වාර්තා කර ඇති බවද හෙළිදරව් කරන ලදී. තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාන්‍ය වයස් සීමා අවුරුදු 68 ක් බවට වාර්තා වූ අතර

2 A. Oppel. and A R Sorkin 'ENRON'S COLLAPSE: The overview; Enron collapses as suitor cancels plans for merger' November 29, 2001

3 Simona Tothova' Corporate Governance failure in the Lehman Brothers case'< ies.fsv.cuni.cz/default/file/download/id/22979> accessed 08 Oct 2014

මූල්‍ය ව්‍යාපාරික කටයුතු පිළිබඳව සෘජු අවබෝධයක් තිබී ඇත්තේ අධ්‍යක්ෂවරු දෙදෙනෙකුට පමණි. කෙසේ වෙතත් ඔවුන්ට ඉහළ මූල්‍ය දීමනා ගෙවා තිබිණි. 2006-2009 වසර තුළදී අවදානම් කළමනාකරණ කමිටුව (Risk Management Committee) රැස්වී තිබුණේ දෙවරක් පමණක් වීම ද නිරීක්ෂකයන්ගේ විශේෂ අවධානයට ලක්ව තිබිණි.

### තම පතට ම බෙදා ගෙන ණය බර කරා ගිය 'වර්ල්ඩ්කොම්' කළමනාකාරීත්වය

වර්ල්ඩ්කොම් (WorldCom)[4] සමාගම දුර්වල යහපාලනය හේතු කරගෙන බිඳ වැටුණ තවත් සමාගමකට උදාහරණයකි. එහි ඉහළ කළමනාකාරිත්වයේ හැර අනෙකුත් සියලු ම පාර්ශ්වයන්ගේ එනම්; කොටස් හිමියන්ගේ, සේවකයන්ගේ හා ණය හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අසමත් විය. ඉහළ කළමනාකාරිත්වයේ ආත්මාර්ථකාමී මූල්‍යමය අපේක්ෂාවන් අන් සියලු පාර්ශ්වයන්ගේ අයිතීන් අභිබවා මතුවීමෙන් වංචනික ක්‍රියාවන් සිදු කර සමාගම බිඳ වැටීම කරා මෙහෙයවා තිබිණි. විශේෂයෙන් ම කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ අභ්‍යන්තර පාලනයන් (Internal Controls) කෙරෙහි අවධානයක් යොමු නොකරන ලද අතර එහි ණය බර ඉහළ යෑමට එකී නොසැලකිලිමත් පරිපාලනය හේතු වී තිබිණ.

ඉහත සාකච්ඡා කරන ලද මූල්‍ය ආයතන බිඳ වැටීම් තුළින් ආර්ථිකයක සමස්ත මූල්‍ය පද්ධතියේ ම ස්ථාවරත්වයට ආයතනික යහපාලනය විසින් ඇති කරනු ලබන බලපෑම හඳුනාගත හැකිය. ආයතනික යහපාලනය මගින් ආයතනයක් විසින් වගකීම් සහගත ආකාරයකින් ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම පිළිබඳව අදාළ වන කළමනාකාරිත්ව රාමුවක් සකසයි. තනි මූල්‍ය ආයතනයක ස්ථාවරත්වයට එය වැදගත් වන අතරම එය සමස්ත මූල්‍ය පද්ධතියෙහි ම ස්ථායිතාවට ද මග පාදයි. ඒ අනුව මූල්‍ය පද්ධතීන්හි ස්ථායිතාවට අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් ආයතනික යහපාලනය මූල්‍ය සේවාවන්ට අදාළ නීති රෙගුලාසි හා විධිවිධාන සුවිශේෂ අවධානයකට පාත්‍ර වී තිබේ.

### ලොව පුරා ආයතනික යහපාලනය ඔසවා තැබූ රෙගුලාසි වපසරිය

අන්තර්ජාතික නීති රාමුව තුළ ආයතනික යහපාලනයට අදාළ විධිවිධානවල විකාශය සැළකීමේදී යුරෝපීය හා උතුරු ඇමරිකානු ආයතනික ආයෝජකයන් (institutional investors) විසින් International Corporate Governance Network[5] පිහිටුවීමත්, OECD සහ ලෝක බැංකුව විසින් Global Corporate Governance forum පිහිටුවීමත්, පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයන් විසින් Commonwealth Association for Corporate Governance යන සංගමය පිහිටුවීමත් විශේෂ සන්ධිස්ථානයන් ලෙස හඳුනා ගත හැකිය. එංගලන්තයේ හා ඇමෙරිකා එක්සත් ජනපදයෙහි යහපාලනයට අදාළව සකසන ලද නීති රෙගුලාසි මෙයට අදාළ නීති ක්ෂේත්‍රය තුළ ප්‍රකටව පෙනෙන අතර 1998 දී එංගලන්තයේ නිකුත් කරන ලද Hampel Code, Turnbull Report on International Controls – 1999, Smith Report on Audit Committee (2009) හා Higgs Report on review of the role and responsibility of Non-executive Directors (2003)[6] එංගලන්තය විසින් පනවන ලද එවන් විධිවිධානයන්ට නිදසුන් වේ. ආයතනික යහපාලනයට අදාළව විශේෂයෙන් ම මූල්‍ය ගනුදෙනු පිළිබඳව අනාවරණය කිරීමට අදාළ රීතිය හා ගිණුම්කරණ පරිචයන්ට අදාළව ඇමෙරිකා එක්සත් ජනපදය විසින් හඳුන්වා දෙන ලද නෛතික රාමුවක් ලෙසට Sarbanes - Oxley Act හඳුනා ගැනේ. මෙයට අමතරව Basel Committee for Bank Supervision (BCBS) විසින් වරින් වර බැංකු ආයතනවල යහපාලනය තහවුරු කිරීම සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ මගින් ආයතනික යහපාලනය සම්බන්ධව පුළුල් කතිකාවක් මූල්‍ය ආයතන නියාමන හා අධීක්ෂණ ක්ෂේත්‍රය තුළ මතු කර තිබේ[7] .

### ශ්‍රී ලංකාවේ බැංකු සහ මූල්‍ය ආයතන ව්‍යුහය යහපාලනය කරා යොමු කරන ප්‍රතිපත්තිමය විධිවිධාන

ශ්‍රී ලාංකීය නෛතික පද්ධතිය සළකා බලන කල 1997 වසරේදී මූලික යහපාලන රෙගුලාසි සමූහයක් වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අතර එය 2009 දී සංශෝධනය කර කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම් සඳහා යහපාලනය සම්බන්ධ මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී. 2009 වසරේදී විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව විසින් ඉහත කී රීති මාලාව ස්වෙච්ඡාවෙන් පිළිපදින ලෙසට දන්වන ලදී. මෙයට පෙරාතුව 2003 වසරේදී ස්වෙච්ඡාවෙන් පිළිපැදිය යුතු යහපාලනයට අදාළ රීතින් පද්ධතියක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද නිකුත් කර තිබිණි. බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන සම්බන්ධව දේශීය වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද සිදුකළ හැකි නිරීක්ෂණයක් නම් එම ආයතන අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නිකුත් කරන නීති රෙගුලාසි හුදෙක් ඒවාට අනුගත නොවීමේ දඩුවමින් මිදීම සඳහා පමණක් පිළිපදිනු මිස අදාළ රෙගුලාසිවල

4 www.nytimes.com/.../worldcom-s-collapse-the-overview-worldcom-files>accessed 2Oct 014

5 Internatonal corporate Governance network

6 en.wikipedia.org/wiki/UK_Corporate_Governance_Code>

7 Basel Committee on Banking Supervision 'Principles for enhancing corporate governance' October 2010

සැබෑ අරුත (rational of regulation) අවබෝධ කර නොගැනීමයි. එම නිසා ප්‍රතිපත්ති මූලික (Principles based) නියාමන හා අධීක්ෂණ රෙගුලාසි ක්‍රමවේද වෙනුවට රීති මුල් කරගත් (Rule based) ක්‍රමවේද හඳුන්වා දී තිබෙන බව පෙනී යයි. ඒ අනුව ස්වේච්ඡාවෙන් ම අදාළ නීතිරීති පිළිපැදීම සාර්ථක නොවන බැවින් වර්තමානය වන විට යහපාලන රෙගුලාසි පවා අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු රීති ලෙසට මූල්‍ය ආයතන වෙතට නිකුත් කිරීමට සිදුවී ඇත. 'සැබෑ යහපාලනය ස්වයං පාලනයක් විය යුතුය' (best governance is self-governance) යන්න මනා ආප්තයක් වුවද, අධි ධාවනකාරී ලෙසට ලාභය අරමුණු කරගෙන ව්‍යාපාර කටයුතු කරන මූල්‍ය ආයතන එකී තරගයේ තුළදී යහපාලන මූලිකාංග සියල්ලක්ම පාහේ බිඳ දමා ගෙන තිබෙන ආකාරයක් වර්තමානයේ නිරීක්ෂණය කළ හැකි ය.

ඉහත කරුණු හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2008 වසරේදී මුදල් නීති පනත, බැංකු පනත මෙන්ම මුදල් සමාගම් පනත යටතේ ද අනිවාර්යයෙන් ම පිළිපැදිය යුතු යහපාලන රීති පද්ධතීන් බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන වෙතට නිකුත් කරන ලද අතර වරින් වර කරන ලද සංශෝධනයන්ට යටත්ව එකී නීති වර්තමානයේ බලපැවැත්වේ.

බැංකු හා මුදල් සමාගම් විසින් ව්‍යාපාර කටයුතු කළ යුතු ආකාරය දක්වමින් පනවා ඇති නීති රෙගුලාසිවලට අමතරව යහපාලන විධිවිධානයන් ද ඉහත කී ආකාරයට අනිවාර්ය පිළිපැදීමකට යටත්ව පැනවීමට සිදුව ඇත්තේ බලවත් හා සාමාජිකයන් විශාල සංඛ්‍යාවකින් යුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් ස්වේච්ඡාවෙන් යහපාලන ක්‍රමවේදයන් පවත්වා ගැනීම නොසළකා හැරීම හේතුවෙනි. කොටස් හිමියන්ගේ වැඩිපුර නියෝජනයක් සිදු කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලයන් හි දී බලය සුළුතරයක් මගින් අනිසි ලෙස භාවිතා කිරීමක් දක්නට ඇත. එමෙන්ම එබඳු අධ්‍යක්ෂ මණ්ඩල විසින් අවදානම් අවම කිරීම කෙරෙහි උනන්දුවක් නොදක්වන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නිසි පරිදි නොපැවැත්වීම, සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ සීමාවන්ට යටත් නොවී ගනුදෙනු කිරීම හා සමාගමේ වෙනත් සම්බන්ධිත සමාගම් හරහා මහජන මුදල් අයථා පරිහරණය යන කරුණු දුර්වල යහපාලන රාමු බිහි කිරීමට දායක වී ඇත. ඇතැම් අධ්‍යක්ෂවරු සමාගමක උන්නතිය උදෙසා කිසිදු දායකවීමක් සිදු කිරීමට අපොහොසත් වී ඇත.

ආයතනික යහපාලනයට අදාළව ශ්‍රී ලාංකීය නීති පද්ධතියේ විකාශය සැලකීමේදී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීම්වලට අදාළ රීතිවලට (listing rules) යහපාලන විධිවිධානයන් ද ඇතුළත් කරමින් ලැයිස්තුගත සමාගම්වලට එකී රීති පිළිපැදීම අනිවාර්ය කිරීම ද වැදගත් අවස්ථාවක් ලෙසට දැක්විය හැකිය. 2013 වසරේදී වරලත් ගණකාධිකාරී ආයතන මගින් නිකුත් කරන ලද යහපාලන රීති පද්ධතිය (Corporate Governance Code) සංශෝධනය කර වඩා පුළුල් අර්ථකථන හා ශක්තිමත් යහපාලන ක්‍රමවේදයට අවශ්‍ය පසුබිමක් සහිතව ඉදිරිපත් කරන ලදී.

**දෝෂ රැසකට තනි පිළියමක්: ආයතන පමණක් නොව සමස්ත මූල්‍ය පද්ධතිය ම සුවපත් කරන යහපාලනයේ විශිෂ්ටත්වය**

මනා යහපාලනයකින් යුක්ත ආයතනයක කටයුතු සුමට ආකාරයට පවත්වාගත හැකි අතර, එහි වගකීම් සහ වගවීම් (Responsibilities and Accountabilities)[8] තහවුරු වීමටත්, එක් එක් වගකීම් පිළිබඳව ආයතනයේ විවිධ අංශ අතර පැහැදිලිතාවක් පවත්වා ගැනීමටත් යහපාලන ක්‍රමවේදයන් ඉවහල් වේ. මූල්‍ය ආයතනයක් කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීමට එබඳු යහපාලන සැලැස්මක් වැදගත් වන අතර අවසානයේ සමස්ත මූල්‍ය පද්ධතියෙහි ම ස්ථාවරත්වය තහවුරු කිරීමට ඉහළ මහජන විශ්වාසය ද අත්‍යවශ්‍ය සාධකයකි.

ආයතනික තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය (Transparency) තහවුරු කිරීම මෙන්ම එක් එක් අධිකාරියකට පැවරෙන වගකීම් පිළිබඳව පැහැදිලි කිරීමට යහපාලන සැලසුම් මග පෙන්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයට, කළමනාකාරිත්වයට මෙන්ම කොටස් හිමියන්ට ද වගකීම් හා යුතුකම් පැහැදිලිව වෙන් කොට දීම ආයතනයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට තුඩු දේ. උදාහරණයක් ලෙසට සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකාරිත්වය ඇගයීමට ලක් කළ යුතු අතර අනෙක් අතට කළමනාකාරිත්වය දුර්වල නම් එය නිසි පරිදි මෙහෙයවීමට අපොහොසත් වීම සම්බන්ධව වගකිව යුතු වනුයේ ද අධ්‍යක්ෂ මණ්ඩලයයි. තමාට පැවරූ එක් එක් කාර්යයේ වගකීම්සහගත භාවය හේතු කරගෙන එකී කාර්යයන් නිසි අවධානයෙන් හා ප්‍රමිතියකින් යුතුව කිරීමට නැඹුරුවක් ඇති කිරීම ද යහපාලනයෙහි වාසිදායී පැතිකඩකි.

ආයතනයක් තුළ මතු විය හැකි අවදානම් සහගත භාවය අවම කිරීම (lowering risk) යහපාලන ක්‍රමවේදයක් පැවතීමේ තවත් වැදගත් ප්‍රයෝජනයකි. වංචනික ක්‍රියාවන්, රහස් ගනුදෙනු, දූෂණ හා අක්‍රමිකතා සේ ම සමාගමක් අපරාධමය වරදවල් සඳහා වගකීමට ලක්වීම වැනි අවදානම් යහපාලන රාමුවක් ක්‍රියාත්මක කිරීමෙන් වළකාගත හැකි බව පැහැදිලිය. යහපාලනය එක්තරා ආකාරයකට ස්වයං පාලනයක් (self policing) ඇති කිරීම

8 Daily, Catherine M., Dan R. Dalton, and Albert A. Cannella. "Corporate governance: Decades of dialogue and data." Academy of management review 28.3 (2003): 371-382.

සඳහා ද හේතු වන බවට ද තර්ක කළ හැකි ය. සමාග මෙහි එක් එක් ස්තරයන් හරහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන විට අවදානම් කළමනාකරණය කෙරෙහි ඉහළ අවධානයක් යොමු කිරීමට ද අවකාශ සැලසේ. වංචනික හා මූල්‍ය අක්‍රමිකතා ආදී අයථා ක්‍රියාවන් සිදු නොවන බවට කීර්ති නාමයක් හිමි ආයතනයක් පිළිබඳව මහජන විශ්වාසය ඉහළ නැගීම තුළින් ව්‍යාපාරික සාර්ථකත්වයක් අත්කර ගැනීමට ද ඉඩ හසර ලැබේ.

සමාගමක කීර්ති නාමය කෙරෙහි දැඩි බලපෑමක් දුර්වල යහපාලන ප්‍රතිපත්තියක් මගින් ඇති කළ හැකි අතර ඉහළ ලාභ ලබන සමාගමක් ලෙස පමණක් ම පැවතීම වර්තමාන සංකීර්ණ ආර්ථික හා මූල්‍ය වපසරිය තුළ අසීරු කාර්යයක් වනු ඇත. ආයතනයක සැබෑ වර්ධනයෙහිලා යහපාලන ප්‍රතිපත්තිය මගින් ශක්තිමත් කරන ලද කීර්තිනාමය වැදගත් සාධකයක් බව ලොව පුරා පිළි ගැනේ. ප්‍රාග්ධනය නංවාලීමට ද එය වර්තමානයේදී තීරණාත්මකව බලපාන අතර අවසාන විග්‍රහයේදී එය සමස්ත ආර්ථික ප්‍රගමනයට ද බලපෑමක් ඇති කරන බව පෙනී යයි.

**යහපාලන ප්‍රවණතා නියාමනය පහසු කර ආර්ථික යාන්ත්‍රණය සුමට කරයි**

පිලිපීනයේ Institute of Corporate Directors හි සභාපති Jesvs Estanista[9] විසින් ප්‍රකාශ කළ පරිදි යහපාලනය මගින් ආයතනයක් මනාව කටයුතු කරනු ලබන ආකාරය පිළිඹිබු වෙයි. කොටස් හිමියන්ට පමණක් නොව අනෙකුත් සියලු ම අදාළ පාර්ශ්වයන්ටත් (stakeholders) ප්‍රජාවට, සමාජයට මෙන්ම සමස්ත ආර්ථිකයටත් සමාගමක් විසින් වාසිදායක ප්‍රතිඵල අත්කර දිය යුතුය. ඉහළ කාර්යක්ෂමතාවකින් යුතුව ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස පැවතීම ආයෝජකයින් ආකර්ශණය කර ගැනීමට ද ඉවහල් වන අතර එබඳු ආයතනයක ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කිරීම නව රැකියා උත්පාදනය කෙරෙහි ධනාත්මක ලෙසට බලපානු ලබයි. 2004 වසරේදී Georgia State University මගින් සිදු කරන ලද පර්යේෂණයක් මගින් ද සනාථ වී තිබෙන කරුණක් නම්, ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත කාර්යක්ෂම තොරතුරු තාක්ෂණික පද්ධතීන් සහිත මනාව සැලසුම් කළ යහපාලන ප්‍රතිපත්තියක් අනුගමනය කරන ආයතනයක් එකී සැලසුම් නොමැති ආයතනයකට වඩා අවම වශයෙන් 25% කවත් ඉහළ ලාභ ලැබීමට හැකියාව ඇති බවයි[10] .

මනාව සැලසුම් කළ යහපාලන ක්‍රමවේද අනුගමනය කරන සමාගමක සේවකයන් සම්පත් ඵලදායිව යෙදවීමට හා කාර්යක්ෂම සියලු සේවයන් සැපයීමට උනන්දු වීම තුළින් නාස්තිය අවම කරගෙන කටයුතු කිරීමට පෙළඹීම තවත් යහපත් ප්‍රවේශයක් ලෙස දැක්විය හැකිය. මනා පාලනයකින් යුත් සමාගම් පැවතීමේ තවත් වාසි ලෙස ප්‍රාග්ධනය අවම පිරිවැයක් යටතේ ලබාගත හැකි වීම මෙන්ම මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම් වැනි ප්‍රතිපත්ති සැලසුම් පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි වීම ද හඳුනාගත හැකි බව ශ්‍රී ලාංකීය මූල්‍ය පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්තමානයේ සිදු කෙරෙමින් පවතින ක්‍රියාමාර්ග ඔස්සේ ද තහවුරු වෙයි.

එයට අමතරව යහපාලන සැලසුම් ක්‍රමවේදයක් අනුගමනය කිරීම මගින් මූල්‍ය ආයතනයකට අත්වන අමතර වාසියක් නම් අවදානම් කළමනාකරණය (Risk Management) සඳහා දැරීමට සිදුවන පිරිවැය අඩුවීමයි. යම්කිසි අවදානම් සහගත තත්ත්වයක් උද්ගත වූ විට එවැන්නක් වළකාලීමට හෝ ඇතිවිය හැකි පාඩුව අවම කර ගැනීම සඳහා සංවිධිත පූර්ව සූදානමක් යහපාලන කාර්යපටිපාටිය යටතේ සකස් කර තිබෙන අවස්ථාවක අවදානමකට විශ්වාසයෙන් යුතුව හා ශක්තිමත්ව මුහුණ දීමට ආයතනයකට හැකියාව ඇත.

කොටස් හිමියන්ගේ ආයෝජන පිළිබඳව ඔවුන්ට ඉහළ විශ්වාසයක් ඇති කර ගැනීමට හැකි වීම යහපාලනය ක්‍රියාත්මක කරන ආයතනයකදී අවකාශ සැලකෙන අතර වත්කම් විකිණීම, සාංගමික ව්‍යවස්ථාවලියේ යම්කිසි වෙනස්කමක් සිදුකිරීම වැනි යම් ආයතනයක මූලික තීරණ ගැනීම් පිළිබඳව දැනුවත්භාවයකින් තමන්ගේ කොටස් ආයෝජනය කළමනාකරණයට ද කොටස් හිමියන්ට අවකාශ සැලසේ.

එමෙන්ම මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය සම්බන්ධව සළකා බලන විට මනා යහපාලනයකින් යුක්තව කටයුතු කරන ආයතනයක් සම්බන්ධව අධීක්ෂණ කටයුතු කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය අඩුවීම (Cost-effective Supervision Process) ආයතනික යහපාලනයෙහි තවත් සුබදායි පැතිකඩකි. එබඳු අවස්ථාවක ආයතනයක අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳව අධීක්ෂණ අධිකාරියට විශ්වසනීයත්වයකින් යුතුව කටයුතු කළ හැකි වනු ඇත. කෙසේ වෙතත් මෙකී වාසිදායිත්වය අත්කර ගැනීමේදී අධිකාරි ආයතනයක් විසින් මූල්‍ය ආයතනයක යහපාලනය ඇගයීමට අවශ්‍යවන හැකියාවක් හා නිරීක්ෂණයන් ශක්තිමත් කරගත යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් හා විගණන කමිටු සමඟ නිරන්තරව සමීපව කටයුතු කළ යුතු බව බාසල් කමිටුව විසින් නිකුත් කර ඇති නවතම මාර්ගෝපදේශවල දක්වා ඇත.

9 J P Estanisalo ‘Good Governance is the Key’ Key Note Speech on University Convocation in 2008https://www.ue.edu.ph/manila/uetoday/index.php?nav=8.htm

10 Ann K. Buchholtz, Jill A. Brown, and Kareem M. Shabana ‘Corporate Governance and Corporate Social Responsibility’

**විහිදී ගිය ප්‍රතිපත්ති ජාලයක අත්‍යන්ත හරය දෙසට බැල්මක්...**

බාසල් කමිටුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ තුළ ආයතනික යහපාලන සංකල්පවල ගැබ් විය යුතු මූලික ප්‍රතිපත්ති හා සංකල්ප සවිස්තරව දැක්වෙන අතර එය සැකෙවින් දැක්වීම මෙම ලිපිය සම්පූර්ණ වීම සඳහා ඉවහල් වේයැයි සිතමි. පහත දැක්වෙන එම ප්‍රතිපත්ති බැංකුවල යහපාලනය ඉලක්ක කරගෙන වර්ධනය කර ඇත්තේ වුව ද සෙසු මූල්‍ය ආයතන සඳහා ද අනිවාර්යයෙන් අදාළ කර ගත යුතුය යන්න වර්තමානයේ අවධානයට ලක් වන නිසැක තර්කයකි.

1. බැංකුවක උපාය මාර්ගික අරමුණු, අවදානම් කළමනාකරණය හා යහපාලන සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර බැංකුවක කටයුතු පිළිබඳව සමස්ත වගකීමත්, කළමනාකාරීත්වය අධීක්ෂණය කිරීමේ වගකීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැරිය යුතුය.

2. අධ්‍යක්ෂ මණ්ඩලය මනා දැනුමක්, පළපුරුද්දක් මෙන්ම නිසි සුදුසුකම් හා පුහුණුවක් ද ලබා තිබිය යුතුය.

3. ආයතනික යහපාලන ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්ණය කළ යුතු අතර එයට අනුගතව ආයතනය කටයුතු කරන්නේද යන්න අධීක්ෂණය කළ යුතුය.

4. සමූහ ආයතනයක් සම්බන්ධව වන විට සමස්ත ආයතන සමූහයේම යහපාලනය මව් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වේ.

5. ආයතනයේ ව්‍යාපාරික සැළසුම, අවදානම් සීමාව හා අනෙකුත් කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ රාමුව තුළ සිදුවන බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීමට යටත්ව කළමනාකාරීත්වය වගකිව යුතුය.

6. බැංකුව තුළ කාර්යක්ෂම අවදානම් කළමනාකරණ සැලසුමක් (Risk Management Plan) තිබිය යුතුය. ඒ සඳහා අදාළ නිලධාරියෙක් පත් කළ යුතු අතර ඔහුට අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ගැනීමට අවකාශ තිබිය යුතුය.

7. ආයතනයට වෙන් වශයෙන් බලපාන්නා වූ අවදානම් මෙන්ම සමස්ත සමාජයටම බලපාන අවදානම් වෙන්ව හඳුනාගත යුතුය.

8. කාර්යක්ෂම අවදානම් කළමනාකරණයක් සඳහා අභ්‍යන්තර පාලනයන් (Internal Controls) නියම කර ඒවා ඉහළ කළමනාකාරීත්වයට මෙන්ම සමස්ත ආයතනයේ ම ඒ ඒ අංශ වෙත ද මනාව සන්නිවේදනය කළ යුතු ය.

9. අභ්‍යන්තර හා බාහිර විගණනයන් කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය හා ඉහළ කළමනාකාරීත්වය කටයුතු කළ යුතු ය.

10. ආයතනයේ දීමනා හා ගෙවීම් පිළිබඳව නීති හා ක්‍රමවේද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කළ යුතු ය.

11. විචක්ෂණ අවදානම් දැරීම් සමඟ සමානුපාතික වන පරිදි සේවකයන්ට වන්දි ගෙවීම් හා දීමනා ගෙවීම් පිළිබඳව ක්‍රමවේද සකස් කළ යුතු ය.

12. බැංකුවේ මෙහෙයුම් ආකෘතිය/ව්‍යුහය (Operational Structure) පිළිබඳව ඉහළ කළමනාකාරීත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට මනා අවබෝධයක් තිබිය යුතු ය.

13. අන්තර්ජාතිකව පිළිගත් නියාමනයන්ට යටත් නොවී මෙහෙයුම් කටයුතු කෙරෙන බැංකු ආයතන තිබෙන රටවල අධ්‍යක්ෂ මණ්ඩල ඒ ඒ ආයතනය මුහුණ පෑ හැකි අවදානම් සහගත තත්ත්වයන් මනාව අවබෝධ කරගත යුතුය.

14. බැංකුවක යහපාලන ක්‍රමවේදය, ගනුදෙනුකරුවන්ට, තැන්පත්කරුවන්ට, කොටස් හිමියන්ට, අනෙකුත් සියලුම අදාළ පාර්ශ්වයන්ට හා වෙළෙඳපොළ සහභාගි කරුවන්ට ද පැහැදිලිව අවබෝධ වන ආකාරයේ විනිවිද භාවයකින් යුක්ත විය යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන වෙත නිකුත් කර ඇති යහපාලනය සම්බන්ධ විධානයන්[11] ඉහත ප්‍රතිපත්ති මත පදනම්ව සකස් කර ඇති බව කිව හැකිය. ඉහත සඳහන් කරන ලද ප්‍රතිපත්ති සැලකීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සැකසුම කෙරෙහි මෑත කාලීනව විශේෂ අවධානයක් යොමු වන බව පෙනී යයි. ආයතනික යහපාලනය සම්බන්ධව වැදගත් වගකීමක් පැවරී තිබෙන අධ්‍යක්ෂ මණ්ඩලය මනා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් සමන්විත වීම අත්‍යවශ්‍යවන බැවින් ඔවුන්ගේ යෝග්‍යතාව කෙරෙහි අදාළ වන නීති කවරාකාර විය යුතු ද යන්න දේශීයව හා අන්තර්ජාතික නීති රාමුව තුළ ද නිරන්තර විමසුමට ලක් වේ.

11 Central Bank of Sri Lanka 'Laws & Regulations Regulations, Directions, Rules, Guidelines, Circulars & Operating Instructions'< www.cbsl.gov.lk/htm/english/09_lr/l_2.html

අධ්‍යක්ෂ මණ්ඩල සැකසුම (Board Composition) පිළිබඳව වූ වර්ධනයන් විමසා බැලීමේදී විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සංයුතිය කෙරෙහි වැඩි අවධානයක් යොමු වී තිබේ. තනි පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ මගින් ඒකාධිපති ස්වරූපයේ බලයක් දැරීම වැළැක්වීම මෙයින් අරමුණු කෙරෙයි. මූල්‍ය අර්බුදයට පසුව එංගලන්තයේ මූල්‍ය ආයතන සම්බන්ධව සකසන ලද වෝල්කර් සමාලෝචන වාර්තාවේ (Walker Review)[12] යහපාලන ක්‍රමවේදයට අදාළව දක්වා ඇත්තේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්, විධායක අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන සැලසුම් අභියෝගයට ලක් කිරීමට හා පරීක්ෂාවට ලක් කිරීමට හැකියාවක් ඇති අය විය යුතුය. එම වාර්තාවේ ඇතුළත් තවත් සුවිශේෂ යෝජනාවක් නම් වසර දෙකට හෝ තුනකට වරක් බාහිර පාර්ශ්වයක් ලවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාර්ථකත්වය ඇගයීමකට ලක් කළ යුතු අතර එම වාර්තාව වාර්ෂික වාර්තාවෙහි කොටස් හිමියන්ගේ ද දැනගැනීම උදෙසා පළ කළ යුතු බවයි. මෙබඳු යෝජනාවලින් ද ප්‍රකට වනුයේ වර්තමානයේ මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ආයතනයක මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමෙහිලා පැවරී ඇති බාරධූර වගකීමයි. එය නිසි පරිදි ඉටු කිරීමට විශේෂඥ දැනුමින්, අත්දැකීම් හා හැකියාවන්ගෙන් සමබර වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබීම අනිවාර්ය සාධකයකි.

**අධ්‍යක්ෂ මණ්ඩල වගකීම විමධ්‍යගත කිරීම හෙවත් කමිටු හතරේ උපක්‍රමය**

ආයතනික යහපාලන සංකල්පයෙහි නූතන නැඹුරුතාවන් පිරික්සීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු (Board appointed Committees) පිළිබඳව යොමු වී ඇති අවධානය ද සඳහන් කළ යුතුය. ප්‍රධාන වශයෙන් කමිටු හතරක් එනම්, විගණන කමිටුව (Audit Committee), මානව සම්පත් සහ වේතන කමිටුව (Human resources and Remuneration committee), නාමයෝජනා කමිටුව (Nomination Committee) හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (Integrated Risk Management Committee) යන කමිටු මෙහිදී වැදගත් කමිටු ලෙසට පිළි ගැනේ.

මෙම කමිටු අතරින් විගණන කමිටුව වෙත විශේෂයෙන් පැවරෙන වගකීමක් ලෙසට ශ්‍රී ලාංකීය මූල්‍ය පද්ධතියට අදාළව පෙන්වා දිය හැකි වන්නේ සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ ගනුදෙනු මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි අවංක භාවය හා විනිවිද භාවය පලුදු වන ආකාරයේ කටයුතු කිරීම වැළැක්වීමට ක්‍රියා කිරීමයි.

අවදානම් කළමණාකරණ කමිටුව විසින් යම්කිසි අවදානම් සහගත තත්ත්වයක් උද්ගත වූ පසුව ක්‍රියාත්මක වීම (reactive manner) වෙනුවට එවැන්නක් උද්ගත වීමට පෙර සිටම (proactive manner) කටයුතු කළ යුතු වේ. මුලින් ද සඳහන් කළ ආකාරයට Enron සමාගමට මෙවැනි කමිටුවක් තිබුණු නමුත් 2006 සහ 2007 කාලය තුළ එම කමිටුව රැස්ව තිබුනේ දෙවතාවක් පමණි. WorldCom සමාගම විසින් අවදානම් කමිටුව පිහිටුවන ලද්දේ එය බිඳ වැටුණ පසුවයි. ඒ අනුව විශේෂයෙන් ම ද්‍රවශීලතා අර්බුදය, ගනුදෙනුකරුවන්ගේ ප්‍රධාන සේවකයන් ඉවත් වීමේ තත්ත්වයන්, නඩු පැවරීම්වලට ලක්වීම් හෝ සේවා හා අනෙකුත් නිෂ්පාදන බිඳ වැටීමේ තත්ත්වයන් සළකා බලා එම ක්ෂණික කළමනාකරණ සැලසුම් සකස් කළ යුතුය.

අන්තර්ජාතික වශයෙන් විකාශය වී ඇති ඉහත විග්‍රහ කරන ලද ආයතනික යහපාලනයෙහි මූලික අංග සලකා බලන කල ප්‍රකටව ම දිස්වෙන ආයතනයක යහපාලන සංකල්පයෙහි නූතන නැඹුරුතා කීපයක් හඳුනා ගැනීමට හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ක්‍රියාත්මකවීම් හා කාර්යභාරයන් මෙන්ම ඔවුන්ගේ සුදුසුකම් හා හැකියාවන් කෙරෙහි සමාගම්වල හිමිකරුවන් දැඩි අවධානයක් යොමු කිරීම මෙබඳු නැමියාවන් අතර ප්‍රමුඛ වේ. අනුමත ප්‍රාග්ධන වෙන් කිරීම් සිදු කිරීම, දුර්වල වත්කම් කළමනාකරණය හා කාර්යක්ෂමතාව නැංවීමට ගතයුතු ක්‍රියාමාර්ග කෙරෙහි මේ යටතේ මූලික අවධානයක් යොමු කෙරෙනු ඇත.

කොටස් හිමියන්ගේ වගකීම් සහගත භාවය (Shareholders' Responsibility) තවත් අවධාරණය වන අංගයක් ලෙසට පෙන්වා දියහැකිය. ආයතනයක මූලික ගනුදෙනු හා ආයෝජකයන්ට අදාළ වන කරුණු විනිවිද භාවයකින් යුක්තව සිදු කිරීමටත්, ඒවා හෙළි කිරීමටත් කොටස් හිමියන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බල කිරීම මෙහිදී සිදු කෙරෙයි. ආයතනික යහපාලනය සම්බන්ධ නෛතික රාමුව තව තවත් ශක්තිමත් කරමින්, විශේෂයෙන්ම මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරකිමින් ආයතනික යහපාලනය තුළින් සලසාගත හැකි පිටුබලය කෙරෙහි අවධානය යොමු කරමින් සවිස්තරාත්මක හා දැඩි ස්වරූපයේ නීති රෙගුලාසි (stringent regulation on corporate governance) නිකුත් කිරීම මේ යටතේ හඳුනාගත හැකි තවත් වර්ධනයකි.

අධ්‍යක්ෂවරුන්ගේ ධූර කාලය සම්බන්ධව මෙන්ම විගණකවරුන්ගේ පත් වීමේ කාලය සම්බන්ධව ද යම් යම් සීමා පැනවීම කෙරෙහි අවධානය යොමු වීම තවත් විශේෂ වර්ධනයකි. සැබවින්ම ස්වාධීන විගණන මතයන් හා වාර්තාවන් ඉදිරිපත් කිරීමට විගණන ආයතනයෙහි

12 A review of corporate governance in UK banks and other financial industry entities'26 November 2009

ස්වාධීන භාවය වැදගත් වන අතර, එක් ආයතනයක් සමඟ කටයුතු කළ හැකි කාල සීමාව සම්බන්ධව විගණකවරුන්ට සීමා පැනවීමෙන් එකී ස්වාධීනත්වය නැංවෙන බවට තර්ක කළ හැකිය.

තොරතුරු තාක්ෂණික පද්ධතිවලට අදාළව කෙරෙන අපරාධමය වැරදි හා ආයතනයක සුමට පැවැත්ම හා කීර්ති නාමය සම්බන්ධයෙන් ඇති විය හැකි අවදානම් අවම කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නැඹුරු කිරීම තවත් වැදගත් වර්ධනයක් වේ.

සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිගෙන් මෙතෙක් අපේක්ෂා කළ සාම්ප්‍රදායික ස්වරූපයේ කාර්යභාරය වෙනුවට පුළුල් වගකීම් සහගත කාර්ය භාරයක් වර්තමානයේදී නව යහපාලන නීති සංකල්ප යටතේ අපේක්ෂා කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට කෙරෙන ගෙවීම්, දීමනා ආදිය සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්ති සැකසීමට ගෝලීය මූල්‍ය අර්බුදය යටතේ අනාවරණය කරගත් වර්ධනය කරගත යුතු යහපාලන නැඹුරුවක් පිළිබඳව ඉහත දී ද සඳහන් කෙරිණි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් විසින් එකිනෙකට සම්බන්ධිත ආයතනයන්හි කටයුතු කරමින් ඒ එක් එක් ආයතනය සම්බන්ධ වූ කරුණුවලදී තීරණ දීම වළකාලීමට අධ්‍යක්ෂ මණ්ඩල ස්වාධීනත්වය තහවුරු කෙරෙන නිර්ණායකයන් තවදුරටත් නිශ්චිත හා පැටුල ලෙස නිර්ණය කළ යුතුව තිබේ.

මෙකී සියලුම කරුණු අතරින් යම් ආයතනයක සංස්කෘතිය තුළට යහපාලන නීති කාවැද්දීම අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස තර්ක කළ හැකිය. ආයතනයක වංචනික ක්‍රියා සහ අක්‍රමිකතාවන්ට එරෙහිව හඬ නගන සේවකයන් රැක ගැනීම (whistle blower protection) සහ පහළ කළමනාකාරිත්වයට පවා යහපාලන වගකීම් පැවරීම ද දූෂණයෙන් තොරව කටයුතු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම ද අනිවාර්ය වන පිළිවෙත් අතර වේ[13].

සාර්ථක හා විනිවිද භාවයෙන් ඉහළ ආයතනික යහපාලන පද්ධතියක් උදෙසා සමාගමක ගනුදෙනු හා අනෙකුත් වැදගත් කටයුතු පිළිබඳව හෙළිදරව් කිරීම (disclosure), පිළිපැදීම හෝ නොපිළිපැදීමට හේතු දැක්වීම (comply or explain) යනාදී ප්‍රතිපත්ති යටතේ වැඩි තොරතුරු ප්‍රමාණයක් කොටස් හිමියන්ට හා අනෙකුත් අදාළ පාර්ශ්වයන්ට අනාවරණය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරෙයි[14] .

13 Super ‘Corporate Governance - Whistleblower Policy’< ir.superiorenergy.com › Investor Relations>

14 Antoine Faure-Grimaud, Sridhar Arco, Valentina Bruno, December 2005 ‘Corporate Governance in the UK: is the Comply-or-Explain Approach Working?’ DISCUSSION PAPER NO 581

**කෙටිකාලීන පිරිවැයකින් දීර්ඝ කාලීන ප්‍රතිලාභ ලැබීම උදෙසා...**

යහපාලන ක්‍රමවේද යම් මූල්‍ය ආයතනයක් තුළ ස්ථාපිත කිරීමේදී එයට දැරීමට සිදු වන පිරිවැය (Cost of Corporate Governance) පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බවට තර්ක මතු වේ. සැබවින්ම මෙයට ප්‍රතිතර්කයක් ලෙසට ඉදිරිපත් කළ හැකි කරුණක් නම් යහපාලනය සම්බන්ධව වැය වන පිරිවැය කෙටිකාලීන වන අතර ඒ මගින් ලැබෙන වාසිසහගත භාවය දීර්ඝකාලීන බවයි. එහෙයින් වඩාත් ඵලදායි ක්‍රමවේදය ලෙසට වඩාත් වැදගත්ම හා මූලිකත්වය දියයුතු අවදානම් හඳුනාගෙන යහපාලන රාමුව සැකසීමේදී එම අවදානම් සහගත අංශ මූලික කර ගැනීම පිරිවැය කාර්යක්ෂමව උපයෝගි කරගත හැකි ක්‍රමවේදයක් ලෙසට දැක්විය හැකිය. මෙහිදී සාම්ප්‍රදායික වුත් හා අදාළ ආයතනයට ප්‍රබල තර්ජනයක් නොවන්නා වුත් අවදානම් හඳුනා ගැනීමෙන් යහපාලනය ක්‍රියාත්මක කිරීමේදී වැය විය හැකි පිරිවැය අවම කරගත හැකි බව යෝජනා කළ හැකිය.

කෙසේ වෙතත් ආයතනික යහපාලනය තහවුරු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට පමණක් සිදු කළ හැකි කාර්යයක් නොවේ. මනා යහපාලන රාමුවක් මූල්‍ය ආයතන තුළ ස්ථාපිත කිරීමට අධීක්ෂණ හා නියාමන අධිකාරීන්හි නිරන්තර සුපරීක්ෂණය හා මග පෙන්වීම වැදගත් වන අතර ආයතනයක සේවකයන්, කොටස් හිමියන්, විගණකවරුන්, ණය වර්ගීකරණ ආයතන හා මූල්‍ය ආයතන මගින් පිහිටුවාගෙන තිබෙන සංගම් යනාදියට ද එහි වගකීම පැවරෙන අතර තැන්පතුකරුවන් ඇතුළු සෙසු ගනුදෙනුකරුවන්ට ද එකී වගකීමෙන් මිදී යා නොහැක. අදාළ වන නීති හා රෙගුලාසීන් උල්ලංඝනය කරමින් යම් ආයතනයක් ගනුදෙනුවලට එළඹෙන විටෙක ඊට අනුබල නොදී නීත්‍යනුකූල රාමුව තුළ ස්වකීය ගනුදෙනුවලට එළඹීමට ගනුදෙනුකරුවන්ට වගකීමක් පවතින අතර එවැනි වගකීම් පැහැර හැරි විටෙක මූල්‍ය ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කරමින් ඒ වටා බැඳ ඇති යහපාලන බැම්ම දෙදරා යනු ඇත. එමෙන්ම ආයතනික යහපාලනයට අදාළ ජාත්‍යන්තර නීති සම්මතයන් දේශීය නීති රාමුවට අන්තර්ගත කිරීමේදී එක් එක් රටක මූල්‍ය පද්ධතියට ආවේණික වූ කරුණු (country specific circumstances) සළකා බැලිය යුතු අතර එම රෙගුලාසි පමණක් පනවා තිබීමෙන් ආයතනික යහපාලනය තහවුරු කළ නොහැක. ඒවාට අනුගත වීම අනිවාර්යයෙන් ම සැපිරිය යුතු සාධකයක් වන අතර එහිදී අධ්‍යක්ෂවරුන්ගේ මෙන්ම අදාළ මූල්‍ය පද්ධතියේ අවංකභාවය (integrity) සියල්ලට ම ඉහළින් තහවුරු කළ යුතු ගුණාංගයක් බව සඳහන් කළ යුතුය.

# සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ජාතික ප්‍රතිරූපය ඉහළ නැංවීම

**විනීතා හේරත්,**
සන්නිවේදන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ලොව එක් එක් රටවලට ඇති ජාත්‍යන්තර පිළිගැනීම නිශ්චය කෙරෙන්නේ ප්‍රතිරූපය පිළිබඳව ඇති විශ්වාසය මඟිනි. ශක්තිමත්, විශ්වාසවන්ත ප්‍රතිරූපයක් ඇති රටකට අපනයන සඳහා ඇති ඉඩප්‍රස්තා පහසුවෙන් පුළුල් කරගත හැක. සෘජු විදේශ ආයෝජන සහ සංචාරකයන් ආකර්ෂණය කරගත හැක. අනෙක් රටවල අවධානය හා ගෞරවය දිනාගත හැක. ඒ අනුව යහපත් සහ ශක්තිමත් ජාතික ප්‍රතිරූපයක් සහිත රටකට ලෝක ආර්ථිකයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ රැසකි. එමනිසා වත්මන් තරගකාරී ලෝක ආර්ථික රටාව තුළ සංචාරකයන්, ආයෝජකයන්, අපනයන වෙළෙඳපොළ දිනාගැනීමට එකිනෙක රටවල් අතර ඇත්තේ දැඩි තරගයකි. විශේෂයෙන් ම වර්තමාන ලෝක ආර්ථිකය තුළ විශාලතම සහ වේගයෙන් වර්ධනය වෙමින් පවතින අංශයක් වන සංචාරක කර්මාන්තය තුළ මේ තත්ත්වය කැපී පෙනේ. සංචාරක කර්මාන්තයේ වර්ධනය අපනයන ආදායම් ඉහළ යෑමට, රැකියා අවස්ථා ජනනයට සහ යටිතල පහසුකම් ප්‍රවර්ධනයට ඉවහල් වෙයි.

දශක හයකට පමණ පෙර වසරකට විදේශ සංචාරයේ යෙදුනු ලෝක ජනගහනය මිලියන 25 ක් පමණ විය. 1980 දී එම සංඛ්‍යාව මිලියන 278 දක්වාත් 1995 දී මිලියන 528 දක්වාත් ඉහළ ගියේය. 2012 වසරේදී බිලියනය ඉක්මවූ ජනගහනයක් විදේශ සංචාරයේ යෙදෙමින් එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 1.07 ක් ලෝක ආර්ථිකයට එක් කළහ. 2013 වසරේ විදේශ සංචාරවල යෙදුණු ජනගහනය මිලියන 1087ක් වූ අතර ඒ සඳහා ඔවුන් දැරූ වියදම එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 1.4 ක් විය. ලෝක දළ දේශීය නිෂ්පාදිතය සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය සියයට 9 කි. එමෙන් ම ලොව රැකියා නියුක්ත සෑම එකොළොස් දෙනෙකුගෙන් ම එක් අයෙකු සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ රැකියාවක නිරතව සිටී. එමෙන්ම ලෝක අපනයන ආදායම සඳහා සියයට 6 කින් ද සමස්ත සේවා අපනයනය සඳහා සියයට 29 කින් ද සංචාරක කර්මාන්තය දායක වෙයි. මෙසේ වේගයෙන් වර්ධනය වන සහ ඉදිරියේදී තව දුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන සංචාරක ක්ෂේත්‍රයෙන් ප්‍රතිලාභ ලැබීමට තම රටවල ප්‍රතිරූපය ඉහළ නැංවීමට, එය ජාත්‍යන්තර ප්‍රජාව අතරට ගෙනයෑමට එක් එක් රටවල් විවිධ ක්‍රමෝපාය අනුගමනය කරයි. ශ්‍රී ලංකාව ද මෙහිලා විවිධ පියවර ගනිමින් සිටී.

රටකට ජාතික ප්‍රතිරූපයේ ඇති වැදගත්කම, ජාතික ප්‍රතිරූපයෙහි ශක්තිමත් බව අනුව රටවල් ශ්‍රේණිගත කිරීම සහ ජාතික ප්‍රතිරූපය ආවරණය කෙරෙන කරුණු 6 ඇතුළත් ජාතික ප්‍රතිරූප ෂඩශ්‍රය පිළිබඳව මීට පෙර ලිපියකින් සාකච්ඡා කර ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිරූපය කෙරෙහි සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමෙහිලා මෙතෙක් ගෙන ඇති පියවර සහ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී තවදුරටත් ජයගත යුතුව ඇති අභියෝග පිළිබඳ ව සැකෙවින් විමසා බැලීම මෙම ලිපියේ අරමුණ වේ.

**ඉතිහාසය**

වසර දහස් ගණනකටත් පෙර සිට ම අප රට ජාත්‍යන්තර කීර්තිනාමයක් දිනා සිටියේ ය. ඉතාමත් ම යහපත් සහ ශක්තිමත් ප්‍රතිරූපයක් ඇතිව සිටියේ ය. ශ්‍රී ලාංකික රජවරු විදේශ රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනගා ගත්හ. ඒවාට තානාපතිවරු යැවූහ. මෙම

රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල වාර්තාගත ඉතිහාසය ක්‍රි.පූ. 3 වැනි සියවස දක්වා දිව යයි. භාරතය පාලනය කළ අශෝක අධිරාජ්‍යයා හා ශ්‍රී ලංකාව පාලනය කළ දේවානම් පිය තිස්ස රජු අතර මෙවැනි රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනැගී තිබිණි. ග්‍රීසිය, රෝමය හා චීනය යනාදි රටවල් රැසක් සමඟ ද රාජ්‍ය තාන්ත්‍රික සහ වෙළෙඳ සම්බන්ධතා පැවති බව නොයෙකුත් වාර්තාවලින් හෙළිදරව් වේ.

එමෙන් ම අතීතයේ සිට ම ශ්‍රී ලංකාව සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගැනීමට සමත්ව සිටි බැව් දේශාටන වාර්තාවලින් තහවුරු කෙරේ. මුහුදු සේද මාවතේ මැද පිහිටීම නිසාත් නොයෙකුත් වටිනා වෙළෙඳ ද්‍රව්‍ය මෙරටින් ලබා ගත හැකි වූ නිසාත් බොහෝ විදේශිකයෝ මෙරටට පැමිණියහ. ඔවුහු විවිධ නම්වලින් හැඳින්වූ ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සිය රටවල පතළ කළහ. පසුව බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයට නතුවීමත් සමඟ විදේශ රටවල් සමඟ පැවති සබඳතාවල ස්වරූපය මුළුමනින් ම වෙනස් විය. නිදහසින් පසු ගෙවුනු වසර 66 තුළ ජාත්‍යන්තර ප්‍රජාව අතර ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විටෙක ඉතාමත් ම ශක්තිමත් එකක් ලෙසත් තවත් විටෙක දුර්වල එකක් ලෙසත් ස්ථාපිතවී තිබිණි. එමනිසා ලෝක ප්‍රජාව ඉදිරියේ ශක්තිමත් ප්‍රතිරූපයක් සහිත රටක්, ජාතියක් ලෙස පෙනී සිටීමට එම කාලපරිච්ඡේදය තුළ නොයෙකුත් පියවර ගෙන ඇත. වැඩසටහන්, සැලසුම් ක්‍රියාත්මක කර ඇත.


නිදහසින් පසු ගෙවුනු යුගය පිළිබඳ විමසා බැලීමේදී බලයට පත් සෑම රජයක් ම පාහේ සංචාරක ක්ෂේත්‍රය තුළින් රටට ලැබිය හැකි ප්‍රතිලාභ හඳුනාගෙන එය වැඩි දියුණු කිරීමට පියවර ගෙන තිබෙන බව දක්නට ලැබේ.. උදාහරණ වශයෙන් 1948 රජයේ සංචාරක කාර්යාංශය පිහිටුවීම, 1965 කටුනායක ගුවන් තොටුපොළ සංවර්ධනය, 1966 ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය, හෝටල් සංස්ථාව සහ හෝටල් පුහුණු පාසල පිහිටුවීම දැක්විය හැක. මෙම වැඩපිළිවෙළවල ප්‍රතිඵල ලෙස 1966 සිට ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාවත් ඒ මඟින් ලැබුණු ආදායමත් ක්‍රමයෙන් ඉහළ ගිය බැව් දක්නට ලැබේ. 1966 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් ගේ සංඛ්‍යාව 18,969 ක් වූ අතර 1967 දී එම සංඛ්‍යාව 23,666 ක් විය. එහෙත් මෙය එදා මෙදාතුර ඒකාකාරී ආකාරයෙන් සිදුවී යැයි පැවසිය නොහැක. (01 වැනි රූප සටහන)

1983 - 1984 කාලය ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය පිරිහෙමින් තිබුණු අවධියකි. ත්‍රස්තවාදය හා තරුණ අසහනය වැනි නොයෙකුත් හේතු නිසා මෙම කාලයේ සංචාරකයන් අතර ලංකාව පිළිබඳ ව පැවති ප්‍රතිරූපය විශ්වාසවන්ත, ශක්තිමත් එකක් නොවුනි.

පසුගිය දශකවල සංචාරක ව්‍යාපාරය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හේතු අතරින් තිස් අවුරුද්දක් තිස්සේ දිග්ගැසුණු ත්‍රස්තවාදී යුද්ධය ප්‍රධාන ය. සංචාරක ආකර්ෂණය බෙහෙවින් දිනාගැනීමට ශක්‍යතාවක් තිබූ ප්‍රදේශ අනාරක්ෂිත බව හේතුවෙන් දශක කිහිපයක් ම සංචාරක ක්ෂේත්‍රය තුළින් ගිලිහී තිබිණි. දකුණු සහ මධ්‍යම පළාත් පමණක් සංචාරක කර්මාන්තය සඳහා විවර ව තිබිණි.

**01 වැනි රූප සටහන**

**සංචාරක පැමිණීම් 1983 - 2013**




මූලාශ්‍රය - Economic & Social Statistics of Sri Lanka

**2004 - 2013 දශකයේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා ගෙන ඇති පියවර**

මෙම කාලපරිච්ඡේදය පිළිබඳව අවධානය යොමුකිරීමේ දී 2004 වර්ෂය සුවිශේෂ ය. එතෙක් පැමිණි ඉහළම සංචාරකයින්ගේ සංඛ්‍යාව වූ 566, 202 වාර්තා වූයේ එම වර්ෂයේ යි. එමෙන් ම සංචාරක ඉපයීම් ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 513 දක්වා සියයට 10 කින් වර්ධනය විය.

මෙවන් සුබදායී වාතාවරණයක් තුළ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිරූපය සංචාරකයන් අතරට ගෙන යෑමට ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සහ ශ්‍රී ලංකා සංචාරක අමාත්‍යාංශය එක්ව 'නැවත ගොඩනැගෙනු ශ්‍රී ලංකා' නමින් විශේෂිත ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කර ඇත. එමෙන් ම 2004 වසරේ දිවයිනට ගොඩබැසීමේ දී අයකළ ගුවන් තොටුපළ ආගමන බද්දෙන් 1/3 ක් සහ සංචාරක මණ්ඩලයෙහි ලියාපදිංචි සංචාරක ආයතනවල මුළු පිරිවැටුමෙන් සියයට 1 ක් වූ බද්දෙන් ලද ආදායම ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයෙහි ප්‍රචාරන කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය සඳහා යොදවමින් සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා පියවර ගෙන ඇත.

එහෙත් 2005 වසරේ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිරූපය කෙරෙහි ප්‍රමාණවත් තරමින් සංචාරකයින් ආකර්ෂණය වූයේ නැත. සුනාමි ව්‍යසනය හා ඒ පිළිබඳ අහිතකර ප්‍රචාර ඊට හේතු විය. වසර අවසාන භාගයේ උතුරු නැගෙනහිර දෙපළාත්වල ඇති වූ යුධ ගැටුම් මේ තත්ත්වය තවත් තීව්‍ර කළේ ය. එවැනි පසුබිමක් තුළ 2005 වසරේ සංචාරක පැමිණීම් සියයට 3 කින් පහළ ගියේය. කලාපීය වශයෙන් ගත් කළ ශ්‍රී ලංකාවට අඛණ්ඩව ම සංචාරයන් පැමිණි විශාලත ම මූලාශ්‍රය වූයේ බටහිර යුරෝපය යි. එහෙත් 2005 වසරේ එකී කලාපයෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 20.1 කින් අඩු විය. සුනාමි සහන, පුනරුත්තාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පැමිණි ස්වෙච්ඡා සංවිධාන සේවකයන් හා ආධාර කණ්ඩායම් නොවන්නට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව මීටත් වඩා පහළ අගයක් ගැනීමට ඉඩ තිබිණි. එමෙන් ම ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙන් පැමිණි සංචාරකයන් ගේ සංඛ්‍යාව ද සංචාරක පිරිසේ විශාල වෙනසක් සිදුනොවීමට බලපෑවේ ය. එහෙත් මෙසේ පැමිණි පිරිස් ශ්‍රේණිගත හොටල්වල් නවාතැන් ගැනීම සිදුවූයේ ඉතා අඩුවෙනි. එම නිසා සංචාරක අංශයේ මුළු ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 429 දක්වා සියයට 16.3 කින් පහළ වැටිණි.

2006 වසරේ මුල් භාගයේ සංචාරක පැමිණීම් සියයට 17 කින් වර්ධනය වුව ද දෙවැනි භාගයේ පැවති තත්ත්වය එතරම් සුභදායී නොවීය. ඊට හේතු වූයේ ඉතාලිය, ජර්මනිය, ප්‍රංශය සහ ඔස්ට්‍රේලියාව ඇතුළු බටහිර රටවල් විසින් ශ්‍රී ලංකාව සංචාරය සඳහා අවදානම් කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමයි. එයින් වසරේ දෙවැනි භාගයේ සංචාරක පැමිණීම් අධෛර්මත් වීමෙන් සමස්ත සංචාරක පැමිණීම්වල වර්ධනය 1.9 කට සීමා විය. මෙම තත්ත්වය 2007 වසර කෙරෙහි ද බලපෑමෙන් එම වසරේ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් වාර්තා වූයේ සියයට 11.7ක පසුබෑමකි. මෙම කාලයෙහි ශ්‍රී ලංකාවේ ආරක්ෂක තත්ත්වය ද යහපත් නොවීය. එහෙත් සංචාරක ප්‍රවර්ධනය සඳහා 2006 අයවැයෙන් පැනවූ එ.ජ. ඩොලර් 10 වීසා ගාස්තුව කල් දැමීමට රජය අනුමැතිය දීම, සංචාරක කටයුතු සඳහා එකතු කළ අගය මත බදු ගෙවීම තාවකාලිකව නතර කිරීම, කල් පසු වූ එකතු කළ අගය මත බදු ගෙවීම වෙනුවෙන් වූ දඩමුදල් නතර කිරීම සහ ප්‍රාග්ධන ගෙවීම් සඳහා සහනයක් ලබාදීම යනාදී කෙටිකාලීන පියවර කිහිපයක් ගෙන ඇත. ඊට අමතරව 2007 ඔක්තෝබර් 01 වැනි දා සිට 2005 අංක 38 දරන සංචාරක පනත හඳුන්වා දෙන ලද අතර ඒ මඟින් සංචාරක කර්මාන්තය කළමනාකරණයේ දී වඩාත් ඵලදායී රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාවක් බිහිවේ යැයි අපේක්ෂා කෙරිනි. නව පනත හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සම්මේලන කාර්යාංශය හා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය පිහිටුවන ලදි.

2008 වසරේ ද විදේශීය සංචාරකයන් අතර ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය එතරම් ආකර්ෂණීය එකක් නොවුනි. එමනිසා සංචාරක පැමිණීම් සියයට 11.2 කින් පහළ ගියේ ය. සංචාරක ඉපැයීම් ද එ.ජ. ඩොලර් මිලියන 342 දක්වා අඩු විය. ඒ සඳහා 2007 වසරේ බලපෑ හේතුවලට අමතරව ගෝලීය මූල්‍ය අර්බුදය ද බලපෑවේය.

2008 වසරේ ඉන්දියාව එක්සත් රාජධානිය, රුසියාව සහ මැද පෙරදිග වැනි රටවල් ඉලක්ක කරමින් 'කළමනාකරණ උපක්‍රම සහ කාර්ය සැලසුම: 2008 - 2010' ඉදිරිපත් කිරීම සහ සංචාරක ක්ෂේත්‍රයේ නියුතු වූවන් හට ලබා දුන් ණය ප්‍රති ලැයිස්තු ගත කිරීම්, ඉන්ධන අධිභාරය හා ආර්ථික සේවා ගාස්තුව (ESC) අය නොකිරීම සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා ගන්නා ලද පියවර ය.

මෙසේ සෑම වසරකම පාහේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා කෙටිකාලීන පියවර මෙන් ම දිගු කාලීන වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලද නමුදු ත්‍රස්තවාදී

යුධ ගැටුම් හේතුවෙන් 2009 වසර තෙක් ම ශ්‍රී ලංකාව බොහෝ දුරට සංචාරක ආකර්ෂණයෙන් ගිලිහී ගියේය. එහෙත් එතෙක් පැවති ඉතාමත් ම බරපතළ උපද්‍රවය වූ ත්‍රස්තවාදය 2009 වසරේ නිමාවීමත් සමඟ ඇතැම් රටවල් විසින් පනවා තිබූ අහිතකර සංචාරක උපදෙස් ලිහිල් කෙරිනි. නැතිනම් ඉවත් කෙරිනි. ඒත් සමඟ ම ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය විශ්වාසදායී ශක්තිමත් එකක් ලෙස සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක්වීමට මංපෙත් විවර විය. 2009 ගැටුම් පැවති මුල් මාස කිහිපයෙහි සංචාරක පැමිණීම් බෙහෙවින් අඩුවුව ද වාර්ෂික පැමිණීම් වර්ධනය සියයට 2.1 ක් විය. සංචාරක ඉපැයීම් ද එ.ජ. ඩොලර් මිලියන 350 දක්වා සියයට 2.2 කින් වර්ධනය විය.

සාපේක්ෂව ගත් විට 2010 වසර ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සංචාරකයන් අතර ආකර්ෂණයට ලක්වීම අතින් සාර්ථක ඇරඹුමක් සනිටුහන් කළ වර්ෂයක් ලෙස සඳහන් කළ හැකි යි. එම වසරේ 2004 වාර්තා වූ ඉහළ ම සංචාරක පැමිණීම් සංඛ්‍යාව ඉක්මවා ගිය අතර එහි වර්ධනය සියයට 46.1 ක් විය. මෙයට බෙහෙවින් ම බලපෑවේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් මතුවෙමින් පැවති විශ්වාසය යි. ඒ අනුව ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව සහ ජපානය වැනි රටවල් විසින් සංචාරකයන් සඳහා නිකුත්කර තිබූ අයහපත් සංචාරක උපදෙස් ලිහිල් කෙරිනි.

ඒ අනුව 2009 වසරේ එක්සත් ජනපද ඩොලර් මිලියන 350ක් වූ සංචාරක ඉපයීම් 2010 වසරේ එ.ජ. ඩොලර් මිලියන 576 ක් දක්වා සියයට 64.6 කින් වර්ධනය විය. මෙම තත්වය තව දුරටත් වර්ධනය කරනු වස් 2011 වසර 'නරඹමු ශ්‍රී ලංකා' (Visit Sri Lanka) ලෙස නම් කර මාස 12 සඳහා තේමා 12 ක් යටතේ ප්‍රචාරන ව්‍යාපාරයක් ගෙන යෑමට සැලසුම් කරන ලදි.

එමෙන්ම දශක කිහිපයක් තිස්සේ සංචාරක ආකර්ෂණයෙන් ගිලිහී තිබුණු, එහෙත් සංචාරක ආකර්ෂණය සඳහා ඉහළ විභවතාවක් සහිත පාසිකුඩා, අරුගම්බේ, ත්‍රිකුණාමලය, නිලාවේලි, වාකරේ, වෙරුගල් සහ කල්කුඩා වැනි ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති කඩිනම්කිරීමට පියවර ගැනීම, කොළඹ හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල ජාත්‍යන්තරව පිළිගත් හෝටල් ඉදිකිරීමට අනුමැතිය දීම, සංචාරක කර්මාන්ත සම්බන්ධ අයදුම්පත් පිළිබඳ කඩිනමින් කටයුතු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මධ්‍යස්ථානයක් පිහිටුවීම 2010 වසරෙහි සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා ගන්නා ලද පියවර ය. තහවුරු වෙමින් පැවති සාමකාමී වාතාවරණය තුළ විවිධ ගුවන් සමාගම් කොළඹ දක්වා පියාසැරිය යළි ඇරඹීම ද සංචාරක ආකර්ෂණය සහ විශ්වාසය තහවුරුවීමට හේතු විය.

**සංඛ්‍යා සටහන**
**සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම් (2003 - 2013)**

| වර්ෂය | රුපියල් මිලියන | එක්සත් ජනපද ඩොලර් මිලියන |
|---|---|---|
| 2003 | 42549 | 411 |
| 2004 | 52126 | 513 |
| 2005 | 43151 | 429 |
| 2006 | 42586 | 410 |
| 2007 | 42571 | 385 |
| 2008 | 37094 | 342 |
| 2009 | 40133 | 350 |
| 2010 | 65018 | 575 |
| 2011 | 91926 | 830 |
| 2012 | 132427 | 1039 |
| 2013 | 221720 | 1715 |

මූලාශ්‍රය - Economic & Social Statistics of Sri Lanka


මෙසේ සාමකාමී සුරක්ෂිත රටක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සංචාරකයන් අතර ස්ථාපිතවීම නිසා 2011 වසරේ සංචාරක පැමිණීම් සියයට 30.8 කින් ද සංචාරක ඉපයීම් එ.ජ. ඩොලර් මිලියන 830 දක්වා සියයට 44.2 කින් ද වර්ධනය විය. සංචාරක පැමිණීම් මෙසේ වර්ධනය වෙද්දී හෝටල් සහ ආපන ශාලා ඉදිකිරීම් ආයෝජන සඳහා ඉල්ලුම ද ඉහළ ගියේය. ඒ අනුව 2011 වසරෙහි එවැනි අයදුම්පත් 210 කටත් වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් කටයුතු කරන ලද අතර සංචාරක සත්කාරක නිවාස ඒකක වැඩසටහන් මඟින් ඒකක 143 ක් සංචාරක කර්මාන්තයට එක් කිරීම ද ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා ගන්නා ලද පියවර අතර වේ. 'නරඹමු ශ්‍රී ලංකා' වැඩසටහන යටතේ අපේ උරුමය, සැණකෙළි, සුන්දර දර්ශන, අපට ආවේණික දේශීය ශරීර සුවතා ක්‍රම, ක්‍රීඩා සහ ත්‍රාසය මුසු ක්‍රීඩා, නොකිළිටි වෙරළ තීරය, වන උරුමය සහ වන සතුන් යන තේමා 8 යටතේත් රැස්වීම්, සම්මුති, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන (MICE Tourism) සඳහා සංචාරක පැමිණීම වර්ධනය සඳහාත් පියවර ගෙන ඇත. එමෙන්ම කල්පිටිය, පාසිකුඩා, දෙද්දූව, කුච්චවේලි සිට වාකරේ යාල, හම්බන්තොට, සිලාවතුර සහ යාපනය දක්වා නව සංචාරක ස්ථාන ඇතුළත් කරමින් සංචාරක කටයුතු පුළුල්කිරීමට ඉඩප්‍රස්තාව සලසන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් එයට අයත් නිවාඩු නිකේතන සහ සංචාරක නවාතැන් ප්‍රතිසංස්කරණය සඳහා පියවර ගැනිනි. 2011 වසරෙහි නව සංචාරක පනත කෙටුම්පත් කරන ලද අතර ඒ මඟින් පැවති සංචාරක ආයතන 4 එක් පනතක් යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය යනුවෙන් ආයතන 2 ක් යටතේ ඒකාබද්ධ කරන ලදි.

ගල්ෆ් එයා, චයිනා ඊස්ටන්, ඒරෝස්විට් එයාලයින්ස්, ඕමාන් එයා, ෆින්එයා, හැනන් එයාලයින්ස්, ෆලයිදුබායි, නෝවා එයාවේස්, පකිස්ථාන් ඉන්ටර්නැෂනල් එයාලයින්ස්, ස්පයිස්ජෙට්, එරෝෆ්ලොට් ගුවන් සේවා 11 ක් ශ්‍රී ලංකාවට පියාසැරිය සඳහා ලියාපදිංචිවීම 2011 වසරෙහි සංචාරක ක්ෂේත්‍රයෙහි කැපී පෙනෙන ජයග්‍රහණයන් ය. ශ්‍රී ලංකා ගුවන් සේවය ද ගමන් වාර සහ ගමන් මාර්ග වැඩි කරමින් නැඟී එන වෙළෙඳපොළ ආර්ථිකවලින් සහ යුරෝපයේ සම්ප්‍රදායික සංචාරක ගමනාන්තවලින් ඇතිවල ඉල්ලුමට සරිලන පරිදි පහසුකම් සැලසීමට ඇති හැකියාව පුළුල් කිරීමට පියවර ගත්තේ ය.

2012 ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් සුවිශේෂී වූවකි. එම වසරෙහි සංචාරක පැමිණීම් සියයට 17.5 කින් වර්ධනය වෙමින් ප්‍රථම වතාවට මිලියනය ඉක්මවීය. එමෙන් ම සංචාරක ඉපයීම් ද එ.ජ.ඩොලර් මිලියන 1039 ක් දක්වා සියයට 25.1 කින් වර්ධනය විය. මෙම සුභදායී ප්‍රවණතාව තවදුරටත් රැකගැනීමට සහ වර්ධනය කර ගැනීමට 2012 වසරේ ලොව පුරා වෙළෙඳ හා ගමන් ප්‍රදර්ශන 25 ක් හරහා ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම සහ කල්පිටිය, කුච්චවේලි සහ යාල ප්‍රදේශවල සංචාරක සංවර්ධන කලාප ආයෝජනය සඳහා අනුග්‍රහය දැක්වීම,

**02 වැනි රූප සටහන**

**සංචාරක ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය - 1993 - 2013**




මූලාශ්‍රය - Economic & Social Statistics of Sri Lanka

කුච්චවේලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කාමර 48 කින් සමන්විත හෝටලක් සාදා නිම කිරීම, කාමර 764 කින් සමන්විත නව හෝටල් 11 ක් ඉදිකිරීමට නියමිත පාසිකුඩා ව්‍යාපෘතිය සහ කල්පිටිය ඒකාබද්ධ සංචාරක ව්‍යාපෘතිය කරගෙන යෑම, නව හා අලුත්වැඩියා කරන ලද හොටල් කිහිපයක ව්‍යාපාරික කටයුතු ඇරඹීම, ආසියා ශාන්තිකර කලාපයේ සුපිරි හෝටල් ජාලයක් වන ෂැංග්‍රිලා චීෂියා කාමර 650 කින් සමන්විත සුපිරි හෝටල් සංකීර්ණයක් කොළඹ පිහිටුවීමට කටයුතු කරගෙන යෑම, ෂැංග්‍රිලා සමාගම දකුණු වෙරළබඩ හම්බන්තොට ප්‍රදේශයේ කාමර 400 කින් සමන්විත සංචාරක නිවාස 50 කින් යුත් වෙරළාශ්‍රිත සංචාරක නිකේතනයක් ඉදිකිරීමේ දෙවැනි ව්‍යාපෘතිය ඇරඹීම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංචාරක සත්කාරක නිවාස වැඩසටහන හරහා සංචාරක කර්මාන්තයේ ධාරිතාව ඉහළ නැංවීම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සිය භාරයේ පැවති නවාතැන් 25 ක් අලුත්වැඩියා කිරීම සහ නව සත්කාරක නිවාස 150 ක් ලියාපදිංචි කිරීම ආදී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදි.

ශ්‍රී ලංකාව පිළිබඳ විශ්වාසවන්ත, යහපත් ප්‍රතිරූපයක් සංචාරකයන් අතර වර්ධනය වීම සහ දිගින් දිගටම කරගෙන යනු ලබන ප්‍රවර්ධනාත්මක වැඩසටහන් නිසා 2013 වසරේ සංචාරකයන් මිලියන 1.27කට අධික සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. එය පෙර වසරට වඩා සියයට 26.7 ක වර්ධනයකි. සංචාරක ඉපයීම් ද එ.ජ. ඩොලර් බිලියන 1.7 ඉක්මවා ඉහළ ගියේය. (සංඛ්‍යා සටහන) 2013 වසරේ පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායකයන්ගේ සමුළුව (CHOGM) ද ශ්‍රී ලංකාව දෙස ලෝක අවධානය යොමුවීමට බෙහෙවින් හේතු විය.

සංචාරක ආකර්ෂණය තවදුරටත් ශ්‍රී ලංකාව කෙරෙහි යොමුකර ගැනීමට 2013 වසරේ ද නොයෙකුත් පියවර ගත්නා ලද අතර යටිතල පහසුකම් සංවර්ධනය ඒ අතර කැපී පෙනේ. කල්පිටිය, කුච්චවේලි, යාල සංචාරක ප්‍රවර්ධන කලාපවල ආයෝජන දිරිමත් කිරීම, ඉප්පන්තිවු, වෙල්ලායි සහ උච්චමුනි ආයෝජකයන් තිදෙනෙකුට බදු දීම, වෙල්ලායි දූපතේ ජලාශ්‍රිත නවාතැන් 4 ක් ඉදිකිරීමට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය දීම, එ.ජ. ඩොලර් මිලියන 372 ක් යටතේ කාමර 2547 ක් සහිතව නව හෝටල් ව්‍යාපාර 36 ක් සඳහා අනුමැතිය දීම, අම්පාර, ගම්පහ සහ පුත්තලම දිස්ත්‍රික්කවල මෙතෙක් අවධානයට ලක් නොවූ ආකර්ෂණීය ස්ථාන හඳුනාගෙන එම ස්ථාන ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, පුරනැගුම හා කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීම් ව්‍යාපෘති ආදිය ඒ අතර වේ.

මෙසේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා ගනු ලබන නොයෙකුත් පියවර ඔස්සේ ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් ව්‍යුහය ද පෙර නොවූවිරූ පරිදි පුළුල් කෙරෙමින් තිබේ. ඊට සමගාමීව සංචාරක කර්මාන්තය හා සම්බන්ධ සෘජු හා වක්‍ර රැකියා ජනනයේ ද සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. (02 වැනි රූප සටහන)

බෲන්ඩ් ෆිනෑන්ස් සංවිධානය විසින් ප්‍රතිරූප ප්‍රබලතා දර්ශකය ගණනයේදී සංචාරක අංශයෙහි කාර්යසාධනය පිළිබඳව අවධානය යොමුකරයි. ඒ අනුව 2013 වසරෙහි සංචාරක අංශයෙහි කාර්ය සාධනය අනුව ගණනය කරන ලද ප්‍රතිරූප ප්‍රබලතා දර්ශකයෙහි ගාමක අගය ඉහළම රට වී ඇත්තේ ශ්‍රී ලංකාව යි. මෙම තත්ත්වය ලබාග ැනීම සඳහා ශ්‍රී ලංකාව උදාකරගත් සාමය තීරණාත්මක සාධකයක් වූ අතර නොයෙකුත් සංවිධාන විසින් ශ්‍රී ලංකාව සංචාරය සඳහා ඉතාමත් ම සුදුසු රටක් බවට ප්‍රකාශයට පත් කිරීම ද සංචාරක ආකර්ෂණය වර්ධනය සඳහා බෙහෙවින් හේතු විය. එය තහවුරු කිරීම සඳහා දිගින් දිගටම කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් ද ඉවහල් වූයේය.

මෙතෙක් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සාමාන්‍ය මහජනතාවගෙන් දුරස් වූ ආකාරයෙන් ක්‍රියාත්මක වුවත්, එම දුරස් බව නැති කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරයි. 'සංචාරක ආර්ථිකයේ දිවි නැගුම මෙහෙවර - සංචාරක සත්කාරක නිවහන' මෙයින් එක් ව්‍යාපෘතියකි. මේ යටතේ සංචාරකයන් සඳහා තම නිවසේ පහසුකම් සපයන්නන් වෙනුවෙන් මූල්‍යාධාර සහ උපදෙස් ලබා දෙයි. මේ මඟින් තරු පංතියේ හෝටල්වල නවාතැන් ගැනීමට නොහැකි හෝ සාමාන්‍ය ජන ජීවිතය සමඟ ගැටීමට කැමති හෝ සංචාරකයන්ට එයට අවස්ථාව උදා වෙයි. 'තිරසාර සංචාරක ප්‍රවර්ධනය මඟින් දිළිඳුකමෙන් තොර ශ්‍රී ලංකාවක්' ව්‍යාපෘතිය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතිවල ආයෝජනය දිරිමත් කරයි.

2016 වන විට සංචාරකයන් මිලියන 2.75 ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සංචාරක කර්මාන්තයේ මෑත කාලීන ඉලක්කය යි. එයින් අපේක්ෂිත ආදායම ඩොලර් මිලියන 3.1 කි. කෙසේ වෙතත් මෙකී අරමුණු ඉටුකරගැනීමට දරන ප්‍රයත්නයේදී මුහුණපෑමට සිදුව ඇති අභියෝග රැසකි.

**සංචාරක අංශය විසින් ජයගත යුතුව ඇති අභියෝග**

ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය කෙරෙහි සංචාරක ආකර්ෂණය දිනාගැනීමේ දී දේශීයව මෙන්ම විදේශීයව ද අභියෝගවලට මුහුණදීමට සිදුවෙයි. විදේශීයව මතුවන ප්‍රධානතම අභියෝගය වන්නේ තරගය යි. මේවන විට

චීනය, ඉන්දියාව හා රුසියාව වැනි නැගී එන ආර්ථිකවලින් බිහිවෙන නව මධ්‍යම පංතිය විදේශ සංචාර සඳහා යොමුවීම ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙම වැඩිවන සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ආසියානු කලාපය තුල ම එකිනෙක රටවල් අතර ප්‍රබල තරගයක් මතුව ඇත. මාලදිවයින, ඉන්දියාව, තායිලන්තය, මැලේසියාව, තායිවානය, වියට්නාමය, නේපාලය සහ සිංගප්පූරුව මේ අතර කැපී පෙනේ.

මූල්‍ය අර්බුදයේ අඳුරු සෙවනැලි ලෝක ආර්ථිකය තුළ තවදුරටත් නොමැකී පැවතියත් 2013 වසරේ මිලියන 1087 ජනගහනයක් විදෙස් සංචාරවල නියැලුනහ. එය පෙර වසරට සාපේක්ෂව සියයට 5 ක වර්ධනයකි. 2014 වර්ෂයෙහි මෙම වර්ධනය සියයට 4 - 4.5 ක් පමණ වනු ඇතැයි UNWTO World Tourism Barometer පුරෝකථනය කර තිබේ. එහෙත් 2014 පළමු කාර්තුව තුළ පමණක් මෙම වර්ධනය සියයට 5 ක් විය. කෙසේ වෙතත් නැගී එන ආර්ථිකවල සංචාරකයින්ගෙන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් අප රට වෙත ආකර්ෂණය කර ගැනීමට අප මෙතෙක් සමත්ව නැත. උදාහරණ වශයෙන් 2013 වසරෙහි චීන ජාතිකයෝ මිලියන 98.19ක් විදේශ සංචාරයේ යෙදුනහ. මෙම සංචාර සඳහා ඔවුන් වැය කළ මුදල එක්සත් ජනපද ඩොලර් බිලියන 128.7 කි. 2014 වසරෙහි චීන ජාතිකයන් මිලියන 114 ක් විදේශ සංචාරයේ යෙදෙනු ඇතැයි ද ඔවුන් එම සංචාරවලදී එක්සත් ජනපද ඩොලර් බිලියන 140 ක් වියදම් කරනු ඇතැයි ද ඇස්තමේන්තුකර ඇත. 2013 ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදයේ පමණක් චීන ජාතිකයන් මිලියන 4 ක් තායිලන්ත සංචාරයේ යෙදී ඇත. එහෙත් 2014 ජනවාරි - ඔක්තෝබර් කාලපරිච්ඡේදයේ ශ්‍රී ලංකාවට පැමිණියේ චීන සංචාරකයන් ලක්ෂයක් පමණි. එමෙන් ම 2013 වසරෙහි සංචාරක නියෝජිත ආයතන හරහා පමණක් තායිලන්තය, දකුණු කොරියාව, මැකාවු, තායිවානය, සිංගප්පූරුව සහ මැලේසියාව යන රටවල් වලට චීන ජාතිකයන් මිලියනයකට අධික සංඛ්‍යාවක් සංචාරයේ යෙදී ඇත. මේ අනුව බලන විට අප තවමත් සංචාරක ආකර්ෂණය දිනාගැනීමෙහි ලා ප්‍රමාණවත් තරමින් සමත්ව නැති බැව් පැහැදිලි වේ. මේනිසා ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ රැසක් තව දුරටත් අපට අහිමිව පවතී. සිංගප්පූරුව වැනි රටක් සමඟ සැසඳීමෙන් මේ තත්ත්වය ඉතාමත් ම පැහැදිලි වේ. සිංගප්පූරුව සියයට 100 ක් නාගරික රටකි. එහි මුළු බිම් ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 697 කි. ඉන් වර්ග කිලෝ මීටර් 687 ක් ගොඩ බිම වන අතර ඉතිරි වර්ග කිලෝ මීටර් 10 ජලාශ ය. සිංගප්පූරුව සතු වෙරළ තීරයේ දිග කිලෝ මීටර් 193 කි. මසකට මිලියනය ඉක්මවූ විදේශ සංචාරකයන් සංඛ්‍යාවක් ආකර්ෂණය කරගන්නා සිංගප්පූරුවට 2013 වසරෙහි පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව මිලියන 15.5 ඉක්මවා ගොස් තිබේ. ඉන් මිලියන 7.5 කටත් වඩා වැඩි පිරිසක් පැමිණ ඇත්තේ ඉන්දුනීසියාව මැලේසියාව මහජන චීන සමූහාණ්ඩුව සහ ඉන්දියාව යන නැගී එන ආර්ථිකවලිනි.

එහෙත් 2013 වසරෙහි අප සමත්ව ඇත්තේ සංචාරකයන් මිලියන 1.27 ක් පමණ ආකර්ෂණය කර ගැනීමට යි. සාපේක්ෂව ගත් විට මෙයට වැඩි පිරිසක් ආකර්ෂණය කර ගැනීමේ ශක්‍යතාව අප සතුය. එහෙත් ඒ සඳහා විධිමත් වැඩපිළිවෙළක් අවශ්‍ය වේ. මෙහිලා ප්‍රවර්ධනය කළ යුතු අංශ හඳුනාගැනීම ඉතාමත් ම වැදගත් වේ. වැඩසටහන් විචිත්‍රවත් වීම පමණක් නොසෑහේ. මන්ද එම වැඩසටහන් සෑදිය යුත්තේ අපගේ සතුට සඳහා නොව සංචාරක ආකර්ෂණය සඳහා වන බැවිනි. අපගේ ජාතික ප්‍රතිරූපය පිළිබඳ විශ්වාසය ඔවුන් අතර තහවුරුවන ආකාරයෙනි. සංචාරක ආකර්ෂණයෙහිලා විශ්වාසවන්තභාවය අතිශය වැදගත් වේ. එය බිඳී ගිය තැන ජාතික ප්‍රතිරූපයට ඇතිවන කැළල පහසුවෙන් අකා මකා දැමිය හැකි නොවේ.

විවිධ රටවල් විදේශ රටවල සංචාරවල දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව උපදෙස් නිකුත් කරයි. මෙම උපදෙස්වලින් ඇතැම් ඒවා ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා ජනතාව පොළඹවනසුලු ඒවා වුව ද ඇතැම් ඒවා සංචාරය සම්බන්ධයෙන් නැවත සිතා බැලිය යුතුවන ආකාරයේ ඒවාය. පළවන ඇතැම් තොරතුරු සාවද්‍ය ඒවා වන බව ද දක්නට ලැබේ. උදාහරණ වශයෙන් එක්සත් රාජධානිය ශ්‍රී ලංකාවේ සංචාරය සම්බන්ධයෙන් https://www.gov.uk/foreign-travel-advice/sri-lanka වෙබ් අඩවියෙහි සඳහන් තොරතුරු දැක්විය හැක. එහි ඉවැංජලික ක්‍රිස්තියානින්ට සහ මුස්ලිම්වරුන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවල කෝලාහල සිදුවන බව දක්වා තිබේ. මෙවැනි තොරතුරු මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය පිළිබඳ සංචාරකයන්ගේ විශ්වාසය බිඳී යෑමට ඉඩ තිබේ.


විදේශීය සහ දේශීය වශයෙන් ජයගත යුතුව ඇති අභියෝග රැසක් ම සෘජුව හෝ වක්‍රව මානව ක්‍රියාකාරකම් හා බැඳී පවතී.

සංචාරකයන් මෙරටට පැමිණෙන්නේ විවිධ අරමුණු ඇතිවය. එහෙත් පොදුවේ ඒ සෑම අයෙක් ම අපේක්ෂා කරන්නේ සුවපහසු, ප්‍රියමනාප සංචාරයකි. එහෙත් ඇතැම් අවස්ථාවල සංචාරකයින්ට කෙරෙන නොයෙකුත් අකටයුතුකම්, රැවටිලි, වංචා සහ අඩන්තේට්ටම් පිළිබඳ නොයෙකුත් ප්‍රදේශවලින් වාර්තා වෙයි. ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමේදී ක්‍රෙඩිට් කාඩ් වංචා, හෝටල් සහ ආපන ශාලාවල සිදුවන හොරකම් සහ ගැටකැපීම් ආදියෙන් ප්‍රවේශම් වන ලෙස එක්සත් රාජධානිය හා එක්සත් ජනපදය වැනි රටවල්

සිය ජනතාවට උපදෙස් දෙයි. දුම්රිය ගමනාගමනයේ දී ශ්‍රී ලාංකිකයන් දුම්රිය ප්‍රවේශ පත් සියල්ල මිලදී ගෙන ඒවා විදේශීය සංචාරකයන්ට වැඩි මිලකට විකුණන බව වැනි තොතුරු සඳහන් වීමෙන් රටෙහි සාමාන්‍ය ජනතාව නිරතුරුව සංචාරකයින්ගේ සැකයට භාජනය වීම නොවැළැක්විය හැකිය. එමෙන්ම කායිකව හා වාචිකව කාන්තාවන් අතවරවලට ලක්වීමත් ලිංගික අතවරවලට ගොදුරුවීමත් පිළිබඳ තොරතුරු මෙම වෙබ් අඩවි මඟින් ජනතාව වෙත ගෙන යයි. කොළඹ අවට නිතර දේශපාලන රැළි සහ විරෝධතා ඇතිවන බවත් ඇතැම් අවස්ථාවල ඒවා ප්‍රචණ්ඩකාරී සිදුවීම් දක්වා වර්ධනය වන බවත් නිතර සිදුවන මහාමාර්ග අනතුරු සහ ඩෙංගු උවදුර වැනි දෑ පිළිබඳ මෙම වෙබ් අඩවිවල සඳහන් වෙයි. මෙම තොරතුරු වැඩි ප්‍රමාණයක් සාවද්‍ය ඒවා ලෙස අපට බැහැර කරලිය නොහැක. එමනිසා සංචාරකයන්ගේ ආරක්ෂාව තහවුරු කෙරෙන ආකාරයෙන් වගකීමෙන් යුතුව කටයුතු නොකළ හොත් එය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පසුබෑමට හේතුවනු නොවැළැක්විය හැකිය. සංචාරකයන් විපතට පත්කෙරෙන ආකාරයේ සිදුවීම්වලින් ජාතික ප්‍රතිරූපයට ඇතිවන සෘණ බලපෑම අනාගතයේ රටට හිමිවීමට තිබූ ප්‍රතිලාභ රැසක් අහිමිවීමට හේතු වෙයි. සීමන් ඇන්හෝල්ට් පවසන පරිදි ලෝක ප්‍රජාව අප දකින්නේ අප කරන දෙයින් මිස අප කියන දෙයින් නොවේ. එම නිසා මෙම අහිතකර තත්ත්ව මඟහරවා ගනිමින් ශ්‍රී ලාංකික අනන්‍යතාව සුරැකෙන අයුරින් සංචාරකයන්ට හිතකර විශ්වාසදායී සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම තුළින් සංචාරක ව්‍යාපාරයෙන් ඉමහත් ප්‍රතිලාභ ලැබිය හැකි ය. ඒ සඳහා සංචාරක ව්‍යාපාරය හා බැඳුනු ප්‍රවාහනය, විදුලිය, ජලය, සෞඛ්‍යය, නීතිය හා සාමය, සංචාරක ක්ෂේත්‍රයේ නියුතු මානව සම්පත් පුහුණුව හා කළමනාකරණය යනා දී සියලුම අංශවල ප්‍රමාණාත්මක වර්ධනයක් මෙන් ම ගුණාත්මක වර්ධනයක් සිදුවිය යුතුය. සංචාරක කර්මාන්තය පහසු සහ ඉක්මනින් මුදල් ඉපයිය හැකි මාර්ගයක් නොවිය යුතු අතර එය තිරසාර සංවර්ධනයට ඉවහල්වන ආකාරයේ ඒකාබද්ධ වැඩපිළිවෙළක් යටතේ ක්‍රියාත්මක විය යුතුය.

## සාරාංශය

සමස්තයක් ලෙස ගත් විට 2009 වසරින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීමෙහි ලා ඉවහල් වන සංචාරක ක්ෂේත්‍රයෙහි ධනාත්මක ප්‍රවණතාවක් දක්නට ලැබේ. පසුගිය වසරෙහි ප්‍රතිරූප ප්‍රබලතා දර්ශකයෙහි සංචාරක අංශයෙහි කාර්ය සාධනය බැලීමේ දී රටවල් 100 ක් අතරින් ශ්‍රී ලංකාව ගාමකත්වය අනුව පළමු තැන ගෙන ඇත. මෙම තත්ත්වය ළඟා කර ගැනීම සඳහා යුධ ගැටුම්වල නිමාවත් ආරක්ෂිත සාමකාමී වටපිටාව සහ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ඉවහල් වී ඇත. එහෙත් සංචාරක ක්ෂේත්‍රය විසින් ජයගත යුතුව ඇති දෙස් විදෙස් අභියෝග ද දක්නට ලැබෙයි. මෙම අභියෝග ජය ගැනීමට සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ සියලුම අංශවල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වර්ධනයක් සිදුකළ යුතුය.■



# සංවර්ධනය විෂයෙහි ලා මූල්‍ය සාක්ෂරතාවේ වැදගත්කම

**සංජය වීරසිංහ,** සහකාර අධ්‍යක්ෂ, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ලොව පුරා අසමතුලිතව විසිරී ඇති සම්පත් හුවමාරුව පහසු කරගැනීමට සහ මානව අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා මිනිසා විසින් මූල්‍ය ක්‍රමය නිර්මාණය කරගන්නා ලදී. මූල්‍ය ක්‍රමයකට මූල්‍ය උපකරණ, මූල්‍ය ආයතන, මූල්‍ය යටිතල පහසුකම් සහ මූල්‍ය වෙළෙඳපොළ යන අංග අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතුය. මූල්‍ය ක්‍රමයක් තුළ පවතින උක්ත අංග පිළිබඳව පුද්ගලයා සතු සාමාන්‍ය අවබෝධය මූල්‍ය සාක්ෂරතාව යනුවෙන් හැඳින්වේ. මූල්‍ය අධ්‍යාපනය, මූල්‍ය දැනුම්වත්භාව, මූල්‍ය පරිහරණ කුසලතාව ආදී විවිධ සංකල්පයන්ට මූල්‍ය සාක්ෂරතාව ඉතා සමීප බවක් පෙන්නුම් කරයි. එහෙත් මෙහි දී මූල්‍ය කටයුතු පිළිබඳ විශේෂඥ දැනුම පිළිබඳව අවධානය යොමු නොකරන අතර මුදල් භාවිතය හා මුදල් කළමනාකරණය පිළිබඳව පුද්ගලයකු සතු සාමාන්‍ය දැනීම මූල්‍ය සාක්ෂරතාව ලෙස හඳුනා ගනු ලැබේ.

මූල්‍ය සාක්ෂරතාව යනු "මූල්‍ය අධ්‍යාපනය යන පුළුල් විෂයෙහි එක් අංගයකි"

- *Hira & Loibl, 2005*

එසේම මූල්‍ය සාක්ෂරතාව යන්නට පුළුල් අර්ථයක් ද පවතී. එනම් මූල්‍ය සාක්ෂරතාව යනු,

"සාමාන්‍ය මූල්‍ය සංකල්ප අවබෝධ කරගැනීමට හා භාවිතය සඳහා පුද්ගලයා සතු හැකියාවයි. මේ අනුව ආදායම් ඉපැයීම, වියදම් කිරීම සහ මුදල් කළමනාකරණය කිරීම යනාදිය කෙරෙහි ඵලදායී සහ වඩාත් නිවැරදි තීරණ ගැනීමට මිනිසා සතු හැකියාව මූල්‍ය සාක්ෂරතාව වේ"

- *Servon & Kaestner, 2008*

උක්ත නිර්වචනය මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව පුළුල් අදහසක් ඉදිරිපත් කරයි. එනම් වර්තමාන වාණිජවාදී සමාජය තුළ සෑම පුද්ගලයකුට ම පාහේ තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා විවිධ මූල්‍යමය කාර්යයන්වල නිරතවීමට සිදුවන අතර විවිධ මූල්‍යමය තීන්දු තීරණ ගැනීමට සිදුවේ. මුදල් ඉපැයීම, වියදම් කිරීම මෙන්ම ඒවා ආයෝජනය කිරීම සඳහා ද මූල්‍ය නිෂ්පාදන හා මූල්‍ය ආයතන පිළිබඳව යම් අවබෝධයක් තිබිය යුතුය. එකී තීන්දු තීරණ ගැනීම සඳහා පුද්ගලයන් සතු මූල්‍ය පරිහරණය පිළිබඳව සාමාන්‍ය අවබෝධය මූල්‍ය සාක්ෂරතාව ලෙස ඉහත නිර්වචනය තුළින් විග්‍රහ කෙරේ.

උදාහරණයක් ලෙස පුද්ගලයකුට තම විශ්‍රාම දිවිය සාර්ථකව ගතකිරීමට නම් ඔහු එතෙක් උපයන ලද ධනය නිවැරදිව ආයෝජනය කිරීමේ හැකියාව තිබිය යුතුය. එසේ නොවුවහොත් ඉදිරි විශ්‍රාම කාලයේ දී එම මුදල් නිසි අයුරින් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වනවා පමණක් නොව තම දෛනික අවශ්‍යතා පවා සම්පූර්ණ කර ගැනීමේ දී ගැටලු ඇති විය හැකිය.

මේ අනුව මූල්‍ය සාක්ෂරතාව යනු තම දෛනික කටයුතුවල දී වඩාත් ඵලදායී අයුරින් මුදල් භාවිතා කිරීමට පුද්ගලයා සතු සාමාන්‍ය අවබෝධය බවත් එය නොතිබීම වර්තමාන වාණිජවාදී සමාජය තුළ පුද්ගල යහ පැවැත්ම විෂයෙහි ගැටලු ඇති කිරීමට හේතු වන බවත් හඳුනාගත හැකිය.

ලොව බොහෝ රටවල් ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. එයට හේතු වී ඇත්තේ රටක ආර්ථික සංවර්ධනය කාර්යක්ෂම වීමට සහ එහිදී මුහුණ දීමට සිදුවන ගැටලු අවම කර ගැනීමට ජනතාව සතු ඉහළ මූල්‍ය සාක්ෂරතාව ඉමහත් පිටුබලයක් සැපයීමයි. මෙම ලිපිය තුළින් මූල්‍ය සාක්ෂරතාව තිරසාර සංවර්ධනයට සම්බන්ධ වන්නේ කෙසේද? මූල්‍ය සාක්ෂරතාව මැනීම, අනෙකුත් රටවල් ගෙන ඇති පියවර, ශ්‍රී ලංකාවේ අත්දැකීම් හා ශ්‍රී ලංකාවේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට ගතහැකි ක්‍රියාමාර්ග යන්න පිළිබඳව විමර්ශනය කිරීමට අපේක්ෂිතය.

**ආර්ථික සංවර්ධනය විෂයෙහි මූල්‍ය සාක්ෂරතාවයේ වැදගත්කම**

මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යාමට මෙන්ම ශීඝ්‍ර ආර්ථික වර්ධනයකට ද වැදගත් වේ. මූල්‍ය සාක්ෂරතාව සමාජයක ආර්ථික ක්‍රමය තුළ විවිධ ගැටලු නිරාකරණය කිරීමට උපකාරීවන අතර පහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම විවිධ සමාජ ගැටලු ඇතිවීමට හේතු වේ. ඒ අනුව මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමෙහි ඇති වැදගත්කම් කිහිපයක් මෙසේ පැහැදිලි කළ හැකිය.

මිනිසාගේ ආර්ථිකමය තීන්දු තීරණ ගැනීම සඳහා මෙන්ම යහපැවැත්ම සඳහා ද ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම සෘජු දායකත්වයක් සපයයි. වර්තමානයේ නවීකරණය වූ මූල්‍ය ක්‍රමයක් තුළ නිරන්තරව ම මිනිසාට ආයෝජන කටයුතුවල නිරතවීමට සිදු වේ. ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත පුද්ගලයන්ට මෙවැනි අවස්ථාවල දී නිවැරදි මූල්‍ය ආයතන තුළ තම මුදල් ආයෝජනය කිරීමට හැකි වේ. එනම් වර්තමාන සමාජය තුළ පොන්සි ව්‍යාපාර හෙවත් වංචනික මුදල් ව්‍යාපාර බහුලව ව්‍යාප්ත වේ. මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ද එවැනි ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබේ. පහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත පුද්ගලයන් එවැනි ආයතන තුළ තම මුදල් ආයෝජනය කර විශාල ගැටලුවලට මුහුණ දී ඇත. මෙවැනි ගැටලු මගහරවා ගනිමින් තම ඉතුරුම් ආයෝජන නිවැරදි අයුරින් පවත්වා ගැනීමට ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් තිබිය යුතුය. ලාභය සහ අවදානම පිළිබඳව අවබෝධයක් තිබීමෙන් සමාජයේ සාමාජිකයන්ට තම වත්කම් නිවැරදිව කළමනාකරණය කළ හැකිය. එය වංචනික මුදල් සමාගම්වල ව්‍යාප්තිය අවම වීමට සහ බොහෝ සමාජ ගැටලු නිරාකරණය කරගැනීමට උපකාරී වේ. මේ අනුව නිවැරදි ආයෝජන සහ ඉතුරුම් කටයුතුවලට හා වත්කම් කළමනාකරණයට මෙන්ම සමාජයේ බොහෝ ගැටලු නිරාකරණය කර ගැනීමට ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් ප්‍රජාව සතුවීම අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය පද්ධතියක මනා ක්‍රියාකාරිත්වය සඳහා මූල්‍ය පද්ධතිය තුළ සිටින සාමාජිකයන් සතු මූල්‍ය සාක්ෂරතාව වැදගත් වේ. ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත පාරිභෝගිකයන්ගෙන් යුත් සමාජයක් තුළ මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළ, මූල්‍ය යටිතල පහසුකම් පද්ධතිය, මූල්‍ය උපකරණ යනාදිය ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම පහසු වේ. උදාහරණයක් ලෙස ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් ඇති පාරිභෝගිකයන් සහිත බැංකුවකට ණය අවදානම අවම කරගත හැකිය. එනම් ණය ලබාදීමේ දී සහ වාරික අය කර ගැනීමේ දී පවතින ගැටලු අවම කරගත හැකිය. මෙය බොල් ණය අවම වීමට මෙන්ම අක්‍රිය ණය ප්‍රමාණය අවම වීමට ද උපකාරී වේ. මේ අනුව වක්‍රව සලකා බලන විට මූල්‍ය ආයතනවල ද්‍රවශීලතා අවදානම ද යම්තරමකට අවම වීමට සහ සමස්තයක් වශයෙන් මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව ආරක්ෂාවීමට ද පාරිභෝගිකයන්ගේ ඉහළ මූල්‍ය සාක්ෂරතාව උපකාරී වේ.

ශීඝ්‍රයෙන් වර්ධනය වන තාක්ෂණය තුළින් බිහිවන නවීන මූල්‍ය උපක්‍රම සහ උපකරණ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් ඒවායින් උපරිම ඵල නෙළාගැනීමටත් මූල්‍ය සාක්ෂරතාව වැදගත් වේ. වර්තමාන ලෝකයේ දිනෙන් දිනම නව මූල්‍ය නිෂ්පාදන, නව ඉතුරුම් ක්‍රම, නව මූල්‍ය සේවා සැපයීම් ශීඝ්‍රයෙන් වර්ධනය වනු දැකගත හැකිය. උදාහරණයක් ලෙස අන්තර්ජාලය මගින් බැංකු පහසුකම් සැපයීම පෙන්වා දිය හැකිය. ප්‍රජාව වෙත කාර්යක්ෂම මූල්‍ය පහසුකම් ලබා දීමට මෙවැනි සේවා උපකාරීවන අතර එවැනි තාක්ෂණික මූල්‍ය සේවා තුළින් ප්‍රයෝජන ලබාගැනීම සඳහා පුද්ගලයා සතු මූල්‍ය පද්ධතිය පිළිබඳ දැනුම ඉහළ මට්ටමක තිබිය යුතුය. මේ අනුව ශීඝ්‍රයෙන් වර්ධනය වන ගෝලීය මූල්‍ය ක්‍රමයට අනුගත වීමට සහ එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට ද ඉහළ මූල්‍ය සාක්ෂරතාව උපකාරී වන බව සනාථ වේ.

ලෝකයේ සෑම රටක්ම පාහේ වයස්ගත ප්‍රජාව ඉහළයාමේ උග්‍ර සමාජ ගැටලුවට මේ වන විට මුහුණ දෙමින් සිටියි. ශ්‍රී ලංකාවේ ද 1981 සිට 2011වන විට වැඩිහිටි ජනගහනය සමස්ත ජනගහනයෙන් ආසන්න වශයෙන් 6.6% සිට 12.2% දක්වා ඉහළ ගොස් ඇත. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2012) එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රම බලකාය අඩුවීම සහ යැපෙන්නන් සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළයාම නිසා යැපුම් අනුපාතිකය ද (ශ්‍රම බලකායට අනුපාතිකව යැපෙන්නන්ගේ ප්‍රතිශතය) ඉහළ යයි. මෙහිලා වැඩිහිටියන්ගේ විශ්‍රාම සැලසුම්කරණය අනාගත ආර්ථිකයට සෘජුව බලපාන සාධකයකි. එනම් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් නිවැරදිව ආයෝජනය සහ කළමනාකරණය කිරීමෙන් වැඩිහිටි සුභසාධනය දියුණු කළ හැකිය. මේ සඳහා අදාළ වයස්ගත පුද්ගලයන්ට මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතු අවබෝධයක් තිබිය යුතුය. ඒ අනුව ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් නොතිබීම වයස්ගතවීම නම් වූ

**වගුව 1**

**ශ්‍රම වෙළෙඳපොළෙහි කාන්තා/පිරිමි දායකත්වය - 2013**

| | කාන්තා | පිරිමි | සමස්ත |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | 35.6 | 74.9 | 53.8 |
| ආර්ථිකමය වශයෙන් සක්‍රිය පුද්ගලයන් (ප්‍රතිශතය) | 35.5 | 64.5 | 100 |
| සේවා නියුක්ත අනුපාතය | 93.4 | 96.8 | 95.6 |
| සේවා වියුක්ත අනුපාතය | 6.6 | 3.2 | 4.4 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රජාවිද්‍යාත්මක ගැටලුවෙහි අතුරු ගැටලු නිර්මාණය කිරීම සඳහා ඉවහල්වන බව පෙනීයයි.

ශ්‍රී ලංකාවේ වර්තමාන ශ්‍රම වෙළෙඳපොළ තුළ පවතින උග්‍ර ගැටලුවක් වනුයේ ශ්‍රම වෙළෙඳපොළෙහි කාන්තා දායකත්වය පුරුෂ සහභාගීත්වයට සාපේක්ෂව පහළ ප්‍රතිශතයක් ගැනීමයි. පහත වගුව තුළින් එය අවබෝධ කරගත හැකිය.

මෙම ලිපියෙහි මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව සිදුකර ඇති වෙනත් සමීක්ෂණ පිළිබඳ අන්තර්ගත වන පරිච්ඡේදය තුළ ද සමස්ත වශයෙන් කාන්තාවන්ගේ මූල්‍ය සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ ද උක්ත ගැටලුවට ඉහත තත්ත්වය බලපාන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. මේ අනුව ශ්‍රම බලකාය සඳහා කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීමට ද ඔවුන් සතු මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම වැදගත් වේ. ඒ අනුව මෙවැනි ශ්‍රම වෙළෙඳපොළ ආශ්‍රිත විෂමතා තුලනය කිරීම සඳහා ද ආර්ථිකයක සාමාජිකයන්ගේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

නූතන වාණිජවාදී ආර්ථිකයක් තුළ සෑම පුද්ගලයෙක්ම පාහේ තම පරිභෝජන කටයුතු සඳහා ඉපයීම් සිදුකරයි. මෙම ආදායම් ලැබීම සහ වියදම් කළමනාකරණය තුළින් තම ආර්ථික මට්ටම ශක්තිමත්ව පවත්වාගත හැකිය. කෙතරම් ආදායමක් ලැබුව ද වියදම් කළමනාකරණය නොකරන්නේ නම් ඉන් ඇතිවන ආර්ථික අපහසුතා වෙනුවෙන් ණය ලබාගැනීමට සිදු වේ. දිගින් දිගටම වර්ධනය වන මෙම තත්ත්වය හේතුවෙන් ඔවුන් දුප්පතුන් බවට පත්වේ. එහෙත් ඉහළ මූල්‍ය සාක්ෂරතාවකින් යුත් ප්‍රජාවක් නම් ඔවුන්ට තම මූල්‍ය සම්පත් ආයෝජනය කිරීම පිළිබඳව යම් පමණක හෝ අවබෝධයක් තිබේ. එම නිසා රටක ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම එම රටෙහි දිළිඳුකම පිටුදැකීමට ද පිටුබලයක් වේ.

**වගුව 2**
**තෝරාගත් රටවල මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණ සහ ඒවායේ ප්‍රතිඵල**

| රට සහ වර්ෂය | පොලී අනුපාතය | උද්ධමනය | අවදානම් කළමනාකරණය | නියැදියේ ප්‍රමාණය | පර්යේෂකයන් |
|---|---|---|---|---|---|
| **ඉහළ ආදායම් ලබන රටවල්** | | | | | |
| ඇමරිකාව (2009) | 65% | 64% | 52% | 1,488 | Lusardi and Mitchell (2011) |
| ඉතාලිය (2006) | 40% | 60% | 45% | 3,992 | Fornero and Monticone (2011) |
| ජර්මනිය (2009) | 82% | 78% | 62% | 1,059 | Bucher - Konemen and Lusardi (2011) |
| ස්වීඩනය (2010) | 35% | 60% | 68% | 1,302 | Almenberg and Save-Soclerbergh (2011) |
| ජපානය (2010) | 71% | 59% | 40% | 5,268 | Sekita (2011) |
| නවසීලන්තය (2009) | 86% | 81% | 27% | 850 | Crossan et al. (2011) |
| නෙදර්ලන්තය (2010) | 85% | 77% | 52% | 1,324 | ALessie et al. (2011) |
| **ඉහළ මධ්‍යම ආදායම් ලබන රටවල්** | | | | | |
| රුසියාව (2009) | 36% | 51% | 13% | 1,366 | Klapper and Panos (2011) |
| රුමේනියාව (2010) | 24% | 43% | - | 2,048 | World Bank CPFL Program |
| අසර්බයිජානය (2009) | 46% | 46% | - | 1,207 | World Bank CPFL Program |
| චිලී (2006) | 2% | 26% | 46% | 13,054 | Behrman et al. (2010) |
| **පහළ මධ්‍යම ආදායම් ලබන රටවල්** | | | | | |
| ඉන්දුනීසියාව (2007) | 78% | 61% | 28% | 3,360 | Cole et al. (2010) |
| ඉන්දියාව (2006) | 59% | 25% | 31% | 1,496 | Cole et al. (2010) |
| ගාසා සහ බටහිර ඉවුර (2011) | 51% | 64% | - | 2,022 | World Bank CPFL Program |

මූලාශ්‍රය: Xu.L and Zia.B (2012)

ඉහත සාධක සියල්ල සලකා බලන විට මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම රටක සංවර්ධනය සඳහා ඉතා විශාල දායකත්වයක් සපයන බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම බොහෝ සෙයින් වැදගත් වන අතර නූතනයේ ආර්ථික විද්‍යාඥයන් විසින් බහුලව සංවාදයට ලක්කරනු ලබන සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් (Inclusive Economic Growth) සඳහා සමාජයක සියලු කණ්ඩායම් සහභාගි කරවා ගැනීමට ප්‍රජාව සතු ඉහළ මූල්‍ය සාක්ෂරතාව නිරන්තරයෙන්ම ඉවහල් වේ. ගිනි අවියක් අතැති පුද්ගලයකු එය භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා නොමැති අවස්ථාවක ඔහුගේ ආරක්ෂාවද සලසා ගැනීම ඔහුට අපහසුය. එසේම කෙතරම් ධනය රැස්කළ ද එය මැනවින් පරිහරණය කළ නොහැකි නම් නව ගෝලීය මූල්‍ය ක්‍රමය තුළ සාර්ථක ජීවිතයක් ගත කිරීම අපහසුය. මේ අනුව ඉහත කරුණු සියල්ල සම්පිණ්ඩනය කළ විට ආර්ථික සංවර්ධනය විෂයෙහි ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම අතිශයින් වැදගත්වන බව විද්‍යාමාන වේ.

**මූල්‍ය සාක්ෂරතාව මැනීම**

මූල්‍ය සාක්ෂරතාව මැනීම එතරම් පහසු ක්‍රියාවලියක් නොවේ. එහෙත් විවිධ රටවල විවිධ බුද්ධිමතුන් මූල්‍ය සාක්ෂරතාව මැනීම සඳහා විවිධ ක්‍රමවේද භාවිතාකර ඇත. මේ අතරින් වඩාත් ම ප්‍රචලිත ක්‍රමය වන්නේ සමීක්ෂණ පැවැත්වීම තුළින් මූල්‍ය සාක්ෂරතාව මැනීමයි. මේ සඳහා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව ප්‍රශ්නාවලියක් සකස් කොට ඒ සඳහා නිවැරදි පිළිතුරු ලබාදීමේ හැකියාව ගණනය කිරීමෙන් මූල්‍ය සාක්ෂරතාව මැනීමට බොහෝ විද්වතුන් උත්සාහ ගෙන ඇත. Lusardi & Mitchell මූල්‍ය සාක්ෂරතාව මැනීම සඳහා ප්‍රශ්න තුනකින් යුත් ප්‍රශ්නාවලියක් සකස් කොට ඇත. පොලී අනුපාතය, උද්ධමනය සහ මූල්‍ය අවදානම් කළමනාකරණය යන ප්‍රධාන අංශ තුන පිළිබඳව මෙහි දී අවධානය යොමු කර ඇත. මෙම අංශයන්ට අදාළව මූල්‍ය සාක්ෂරතාව මැනීම සඳහා රටවල් කිහිපයක පවත්වන ලද සමීක්ෂණ කිහිපයක ප්‍රතිඵල 02 වැනි වගුවේ අන්තර්ගත වේ.

(උදාහරණයක් ලෙස පොලී අනුපාතය ගණනය කිරීම සම්බන්ධයෙන් ඇමෙරිකාවේ පුද්ගලයින් 65ක් අවශ්‍ය අවම මට්ටමේ දැනුමක් ලබා ඇත.) විවිධ රටවල මූල්‍ය සාක්ෂරතාව එකිනෙකට වෙනස් මට්ටම්වල පවතින බව ඉහත සමීක්ෂණ ප්‍රතිඵල අනාවරණය කරයි.

පොදු ප්‍රජා විද්‍යාත්මක සාධක අනුව සමීක්ෂණ සිදුකර ඇති සෑම රටකම පාහේ සාපේක්ෂව කාන්තාවන්ගේ මූල්‍ය සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බව අනාවරණය කරගෙන ඇත. මේ හැරුණු විට ආගම, ජනවර්ගය, භාෂාව ආදී සාධක අනුවද මූල්‍ය සාක්ෂරතා මට්ටම විවිධ අගයන් ගන්නා බව හඳුනා ගෙන ඇත. එමෙන්ම අධ්‍යාපන මට්ටම හා ආදායම් විෂමතාව අනුව ද මූල්‍ය සාක්ෂරතාවයේ විෂමතා පවතින බව අනාවරණය කරගෙන ඇත. (Xu.L and Zia.B (2012))

ඉහත වගුව 2 හි දැක්වෙන සමීක්ෂණවලට අනුව ඉහළ ආදායම් සහිත රටවල මූල්‍ය සාක්ෂරතාව විශ්‍රාම සැලසුම්කරණය, සංකීර්ණ ආයෝජන කටයුතු, පෞද්ගලික ණය සහ උකස් කටයුතු යනාදිය සමග බැඳී පවතී. එහෙත් පහළ ආදායම් සහිත රටවල මූල්‍ය සාක්ෂරතාව බැංකු ගිණුම් පවත්වාගෙන යෑම, රක්ෂණ හිමිකම් පවත්වාගෙන යෑම ආදී ප්‍රාථමික මට්ටමේ කටයුතු සමග බැඳී පවතී. මෙම තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ විවිධ රටවල මූල්‍ය සාක්ෂරතාව විවිධ මට්ටම්වල පවතින බවය. මෑතකාලීනව බොහෝ රටවල් ඉහත ආකාරයේ විවිධ සමීක්ෂණ ක්‍රමවේද හරහා තම ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව මැනීමට උත්සුක වී ඇත. මෙසේ මූල්‍ය සාක්ෂරතාව මැනීමට හේතු වී ඇත්තේ රටක ප්‍රජාවගේ ඉහළ මූල්‍ය සාක්ෂරතාව රටේ ආර්ථික කටයුතු පහසු කරගැනීමට උපකාරී වන නිසාවෙනි. එමෙන්ම සෑම සාමාජිකයකුම රටේ ආර්ථිකයෙහි උපරිම ප්‍රතිලාභ භුක්ති විඳීමට නම් ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් තිබීම අත්‍යවශ්‍ය වන බැවිණි.

**මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා විවිධ රාජ්‍යයන් ගෙන ඇති පියවර**

මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා විවිධ රටවල් විවිධ පියවර ගෙන ඇත. ඒ සඳහා ආයතන පිහිටුවීම, සමීක්ෂණ පැවැත්වීම, ජාතික උපායමාර්ග සංවර්ධනය, වැඩසටහන් සංවිධානය සහ දැනුම්වත් කිරීමේ වෙබ් අඩවි ආරම්භ කිරීම මේ අතරින් කිහිපයකි. මෙහි දී බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියාව යන රටවල් ත්‍රිත්වයෙහි අත්දැකීම් පමණක් සාකච්ඡා කරනු ලැබේ.

**නියෝජිත ආයතන පිහිටුවීම**

බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය හා ඕස්ට්‍රේලියාව යන රටවල් ත්‍රිත්වය ම මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා විවිධ අණපනත් සම්මත කොට නියෝජිත ආයතන පිහිටුවා ඇත. මූල්‍ය සේවා සහ වෙළෙඳපොළ පනතට (Financial Services & Markets Act) අනුව බ්‍රිතාන්‍ය තුළ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය සේවා අධිකාරිය (Financial Services Authority) නම් නියෝජිත ආයතනය පිහිටුවන ලදී. ඉහත පනතට අනුව ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙළෙඳපොළ සුරක්ෂිතතාව

තහවුරු කිරීම සහ මෙම ආයතනයට අනුබද්ධ වෙනත් ආයතන පාලනය කිරීම ආදී කාර්යන් රැසක් මූල්‍ය සේවා අධිකාරියට පැවරී ඇත. මේ හැරුණුවිට බ්‍රිතාන්‍ය තුළ මූල්‍ය සේවා අධිකාරිය යටතේ මූලික කුසලතා සංවර්ධන ආයතනය (Basic Skills Agency), පෞද්ගලික මූල්‍ය අධ්‍යාපන කණ්ඩායම (Personal Financial Education Group) වැනි ආයතන ද පිහිටුවා ඇත. බ්‍රිතාන්‍ය මෙන්ම ඇමරිකා එක්සත් ජනපදය ද ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා ආයතන පද්ධතියක් ස්ථාපනය කොට ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය, ෆෙඩරල් රාජ්‍යයේ මූල්‍ය අධ්‍යාපන කටයුතු සම්බන්ධීකරණය, ජාතික උපායමාර්ග සංවර්ධනය කිරීම ආදී කාර්යයන් අරමුණු කොටගෙන මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ පනතට (Financial Literacy and Education Imprомent Act) අනුව ඇමරිකා එක්සත් ජනපදය තුළ මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපන කොමිෂන් සභාව (Financial Literacy and Education Commission) පිහිටුවන ලදී. මේ හැරුණු විට ඕස්ට්‍රේලියාව ද මූල්‍ය සාක්ෂරතා ප්‍රවර්ධන කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතා පදනම් ආයතනය (Financial Literacy Foundation) නමින් නව ආයතනයක් පිහිටුවන ලදී. ඉහතින් දක්වන ලද ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය මූල්‍ය සාක්ෂරතා ප්‍රවර්ධන ආයතනයන්ට බොහෝ සෙයින් සමාන කාර්යය කොටසක් මෙම ආයතනයට ද පැවරී ඇත.

### ජාතික උපායමාර්ග සම්පාදනය

මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා බ්‍රිතාන්‍ය සහ ඇමරිකා එක්සත් ජනපදය ජාතික මට්ටමෙන් උපායමාර්ග රැසක් සම්පාදනය කොට ක්‍රියාත්මක කරමින් පවතී. එහෙත් ඕස්ට්‍රේලියාව තුළ මූල්‍ය සාක්ෂරතා පදනම් ආයතනයෙන් සිදුකරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් හැරුණුවිට පුළුල් මට්ටමේ ජාතික වැඩසටහන් මාලාවක් දක්නට නොලැබේ. බ්‍රිතාන්‍ය තුළ 2003 වර්ෂයේ දී මූල්‍ය සේවා අධිකාරිය විසින් මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් සම්පාදනය කර ඇත. එම සැලැස්මට අනුව මූල්‍ය සාක්ෂරතාව අවම කණ්ඩායම් සමීක්ෂණ තුළින් හඳුනාගැනීම, එවැනි කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම ආදී පියවර යෝජනා කර ඇත. එම යෝජනාවන්ට අනුකූලව 2006 වර්ෂයේ දී අදාළ සමීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත්කොට ඇත. ඒ අනුව අඩු මූල්‍ය සාක්ෂරතාවක් සහිත පාරිභෝගිකයන් තෝරා මුදල් භාවිතය හා මුදල් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බ්‍රිතාන්‍ය කටයුතු කර ඇත.

2006 වර්ෂයේ දී මූල්‍ය සාක්ෂරතා සහ අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය සාක්ෂරතා ජාතික සැලැස්ම සම්පාදනය කොට ඉදිරිපත් කරන ලදී. ඉතිරිකිරීම් සම්බන්ධ ගැටලු, ණය ලබාගැනීම, විශ්‍රාමික ඉතුරුම්, මූල්‍ය සාක්ෂරතාවයෙහි පවතින අර්බුද යනාදී කරුණු මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. 2007 වර්ෂයේ මැදභාගය වන විට මෙම උපාය මාර්ගික සැලැස්මට අදාළ ක්‍රියාමාර්ග ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්, තෝරාගත් විවිධ ජන කණ්ඩායම් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම ඇතුළු මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය විවිධ පියවර රැසක් ගෙන ඇත. මේ හැරුණු විට ප්‍රධාන පාසල් විෂය ධාරාවට මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ විෂය කරුණු ඇතුළත් කිරීමටත් 2007 ඇමරිකානු භාණ්ඩාග ාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් මූල්‍ය සාක්ෂරතා පරීක්ෂණ සමුළුවක් පැවැත්වීමටත් කටයුතු කර ඇත. මේ අනුව පැහැදිලි වන්නේ ඇමරිකාව සහ බ්‍රිතාන්‍ය මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා ජාතික මට්ටමේ ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇති බවයි.

### දැනුම්වත් කිරීමේ වෙබ් අඩවි ආරම්භ කිරීම

මෙම රටවල් තුනම පාහේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේ නියෝජිත ආයතන යටතේ දැනුම්වත් කිරීමේ වෙබ් අඩවි පවත්වාගෙන යයි. බ්‍රිතාන්‍යයේ මූල්‍ය සේවා අධිකාරිය (Financial Services Authority) Moneymadeclear නමින්ද, ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය සාක්ෂරතා සහ අධ්‍යාපන කොමිෂන් සභාව (Financial Literacy and Education Commission) Mymoney යනුවෙන්ද, ඕස්ට්‍රේලියාවේ මූල්‍ය සාක්ෂරතා පදනම් ආයතනය (Financial Literacy Foundation) Understanding Money යනුවෙන් ද වෙබ් අඩවි තුනක් පවත්වාගෙන යයි. මූල්‍ය සාක්ෂරතාව ලබාගත හැකි ඉගෙනුම් ආකෘති, ස්වයං තක්සේරු පරීක්ෂණ ආදිය මෙම වෙබ් අඩවි තුළ අන්තර්ගතය. මෙම වෙබ් අඩවි තුනෙහිම පොදුවේ බදු කටයුතු, බැංකු ගිණුම්, ණය සහ ණය කාඩ්පත්, ණය පාලනය, රක්ෂණ කටයුතු, පාරිභෝගික ආරක්ෂාව, මූල්‍ය සැලසුම්කරණය පිළිබඳ උපදෙස්, ඉතුරුම්, ආයෝජන, පවුල තුළ මුදල් කළමනාකරණය සහ විශ්‍රාම සැලසුම්කරණය යන ක්ෂේත්‍රය ආශ්‍රිත දැනුම අන්තර්ගත වේ.

ඉහත තොරතුරුවලට අනුව ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය සහ ඕස්ට්‍රේලියාව මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇති බව පැහැදිලි වේ.

### මූල්‍ය සාක්ෂරතාව තව දුරටත් ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව ගතයුතු ක්‍රියාමාර්ග

ඉහතින් මෙම ලිපියේ සාකච්ඡා කළ අන්දමට විවිධ රාජ්‍යයන් ඒවායේ මූල්‍ය සාක්ෂරතාව මැනීම සහ හඳුනාගත් පහළ මූල්‍ය සාක්ෂරතාව ඇති සමාජ කණ්ඩායම්වල මූල්‍ය

සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා විවිධ ආයතන පිහිටුවීම, වෙබ් අඩවි ආරම්භ කිරීම, දැනුවත් කිරීමේ පාඨමාලා පවත්වාගෙන යෑම ආදී ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. එමෙන්ම ශ්‍රී ලංකාව ද මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ණය පාලනය හා ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම; මහ බැංකුව විසින් විවිධ ජනමාධ්‍ය හරහා දැන්වීම් පළකිරීම, අත්පත්‍රිකා හා ලේඛන බෙදාහැරීම; වෙනත් වාණිජ බැංකු හා මූල්‍ය ආයතන මගින් මූල්‍ය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී පියවර රැසක් දැනටමත් ගෙන ඇත. මේ හැරුණු විට ජාත්‍යන්තර අත්දැකීම් භාවිතයට ගෙන මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට පහත ක්‍රියාමාර්ගවලට එළැඹිය හැකිය. ඒවානම්,

- මූල්‍ය සාක්ෂරතාව මැනීම සඳහා සමීක්ෂණ සහ පරීක්ෂණ සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම - විවිධ ප්‍රජා කණ්ඩායම්වල මූල්‍ය සාක්ෂරතා මට්ටමේ විෂමතා මෙමගින් හඳුනාගත හැකිය.

- මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම භාවිතයට ගනිමින් අවශ්‍ය නීතිමය රාමුව සකසා එයට අදාළ ආයතනික පද්ධතිය ස්ථාපිත කිරීම - එම ආයතන පද්ධතිය හරහා පාසල් විෂය ධාරාවට මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව ඇතුළත් විෂය නිර්දේශයන් සහ පාඨමාලා සකස් කොට එය සියලුම ශිෂ්‍යයන්ට අනිවාර්ය කිරීම වැනි පියවර ගතහැකිය.

- පහළ මූල්‍ය සාක්ෂරතාව සහිත කණ්ඩායම් ඉලක්ක ප්‍රජාව ලෙස තෝරාගෙන රටේ සමස්ත මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- සියලුම රැකියාවන්හි උසස්වීම් සඳහා කිසියම් තෝරාගත් ශ්‍රේණියක දී මූල්‍ය සාක්ෂරතාව පරීක්ෂා කිරීමේ විභාගයක් පැවැත්වීම.

- මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ නව පාඨමාලා විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ඇතුළත් කිරීම.

- රටේ සමස්ත ප්‍රජාවම ආවරණය වන පරිදි ඒ ඒ මට්ටම්වලට ගැලපෙන ආකාරයේ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- මූල්‍ය සාක්ෂරතා වර්ධන විශේෂ ව්‍යාපෘති හඳුන්වා දී ඒවාට ප්‍රතිපාදන වෙන් කිරීම.

මෙවැනි දීර්ඝ කාලීන ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව යම් මට්ටමකට හෝ ප්‍රවර්ධනය කරගත හැකි වේ. මෙම ලිපියෙහි අදාළ සියලු කරුණු සම්පිණ්ඩනය කළ විට සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ජාත්‍යන්තර අත්දැකීම් ද භාවිතයට ගෙන ඉහතින් සඳහන් කළ ආකාරයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ශ්‍රී ලංකාවට ඵලදායී මූල්‍ය සාක්ෂරතාවක් ළඟාකර ගැනීමට උපකාරී වන අතර එය ශීඝ්‍ර ආර්ථික වර්ධනයට ද විශාල පිටුබලයක් වනු ඇත.■

මූලාශ්‍ර :

*Hira T, and Loidl C (Summer 2005), Understanding the Impact of Employer/provided Financial Education on Workplace Satisfaction. Journal of Consumer Affairs, 39, 1.173(22). Retrieved July 11, 2009, from general one file via gale : http:// find.galegroup.com*

*Servon L J, and Keastner R. (2008), Consumer Financial Literacy and the Impact of Online Banking on the Financial Behavior of Lower/Income Bank Customers.Journal of consumer affairs, hhttp://find.galegroup.com*

*Sri Lanka Labour Force Survey Annual Bulletin - 2013, Department of Census and Statistics*

*Xu.L and Zia.B (2012), Financial Literacy around the World : and Overview of the Evidence with Practical Suggestions for the Way Forward, World bank. Policy Research Working Paper 6107*

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.